# මහ සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව

# 2018 ජූලි මස 19 වන දින

- **08 වන සැසි වාරයේ 04 වන සභා වාර්තාව**

**දිනය :- 2018.07.19 වන දින**

**වේලාව :- පෙ.ව. 10.00**

**ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙනිය**

| පැමිණීම | පිටවීම |
|---|---|
| 01. ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා | පෙ.ව.10.00 |
| 02. ගරු උපසභාපති එම්. ජයන්ත මැතිතුමා | පෙ.ව.10.00 |
| 03. ගරු. ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා | පෙ.ව.10.00 |
| 04. ගරු ප්‍රා.ස.ම සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව.10.00 |
| 05. ගරු ප්‍රා.ස.ම සුගත් සරඹගේ මැතිතුමා | පෙ.ව.10.00 |
| 06. ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව.10.00 |
| 07. ගරු ප්‍රා.ස.ම. අයි .කේ. සුසන්ත පද්මතිලක් මැතිතුමා | පෙ.ව.10.00 |
| 08. ගරු ප්‍රා.ස.ම. එම්.සී. පී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා | පෙ.ව.10.00 |
| 09. ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඒ. සංජීව මැතිතුමා | පෙ.ව.10.00 |
| 10. ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය | පෙ.ව.10.00 |
| 11. ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා | පෙ.ව.10.00 |
| 12. ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය | පෙ.ව.10.00 |
| 13. ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව.10.00 |
| 14. ගරු ප්‍රා.ස.ම ගාමිණී ජයවික්‍රම මැතිතුමා | පෙ.ව.10.00 |
| 15. ගරු ප්‍රා.ස.ම. ජේ. ටී. ශාන්ත මැතිතුමා | පෙ.ව.10.00 |
| 16. ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව.10.00 |
| 17. ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව.10.00 |
| 18. ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා | පෙ.ව.10.00 |
| 19. ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා | පෙ.ව.10.00 |

20. ගරු ප්‍රා.ස.ම. ඩබ්. සී. එම්. චමිල් උදාර මැතිතුමා පෙ.ව.10.00

21. ගරු ප්‍රා.ස.ම. රන්ජන් වීරසේකර මැතිතුමා පෙ.ව.10.00

22.ගරු ප්‍රා.ස.ම. ඩී. රාජසිංහ මැතිතුමිය පෙ.ව.10.00

23. ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා පෙ.ව.10.00

24.ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය පෙ.ව.10.00

25.ගරු ප්‍රා.ස.ම. එන්. ඒ. එස්. වීරසිරි මැතිතුමිය පෙ.ව.10.00

26.ගරු ප්‍රා.ස.ම. ඊ. බී. ඉන්දික මැතිතුමා පෙ.ව.10.00

27.ගරු ප්‍රා.ස.ම. පී.එන්. එස්. ගුණවර්ධන මැතිතුමිය පෙ.ව.10.00

28. ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා පෙ.ව.10.00

**නොපැමිණීම**

01. ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.

02. ගරු ප්‍රා.ස.ම. ජේ. චන්ද්‍රලතා මැතිතුමිය.

**සහභාගි වූ නිලධාරීන්**

01. ලේකම් - ඩබ්. කේ. සුරංග මයා.

02. සංවර්ධන නිලධාරී - ඒ.බී.කේ. සෙව්වන්දි මිය.

03. කළමණාකරණ සහකාර - ජේ. ඒ. චන්ද්‍රලේඛා මිය.

- **ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම**

ගරු සභාපතිතුමා , ගරු උප සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගි වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි.

සියළු දෙනාටම සුබ උදෑසනක්. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ ජූලි මස සභා රැස්වීම සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, ගරු හිටපු සභාපතිවරු දෙපළ හා ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගි වූ ලේකම් මහතා ඇතුළු නිලධාරී දෙපළත් මාධ්‍යවේදී මහත්වරු දෙපළත් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

## 01 - පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.

2018 ජුනි මස 21 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය**

ගරු සභාපතිතුමනි ගිය සභා වාර්තාවේ තීරණ අංක 08 – 8 යටතේ ශිෂ්‍යාධාරයක් ලබා ගැනීම සම්බන්ධ වූ යෝජනාව ගරු ප්‍රා.ස.ම. ඊ. බී. ඉන්දික මැතිතුමා කරන ලද යෝජනාවක් ලෙස සඳහන් කර තිබෙනවා. නමුත් එම යෝජනාව ඉදිරිපත් කලේ මම. එම නිසා මෙම යෝජනාව ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය ඉදිරිපත් කළ යෝජනාවක් ලෙස සඳහන් විය යුතුයි.

**ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා**

සභා වාර්තාවේ යෝජනා අංක 05 – 1 යටතේ කිරම ආයුර්වේද මධ්‍යස්ථානයට ඖෂධ ලබා ගැනීම පිළිබඳ කතා කළා. එහිදී කටුවන හා දෙහිගහහේන ජංගම ආයුර්වේද මධ්‍යස්ථාන නැවත ආරම්භ කිරීමට තීරණයක් ගත්තා. මෙහිදී කටුවන ආයුර්වේද මධ්‍යස්ථානය සඳහා බැංකු සංගමයට ලබා දී ඇති කඩ කාමර ලබා ගන්න කියලා ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා ප්‍රකාශ කර තිබෙනවා. එමෙන්ම බැංකු සංගමය කඩ කාමරවල ඉන්නෙ නැතිනම් අතුරු බදු දීම තහනම් කියා මම සඳහන් කර තිබෙනවා. මෙම කඩ කාමරය බැංකු සංගමයට ලබා දී ඇති කඩ කාමරය ලෙස නොව සමූපකාර සංගමයට ලබා දී ඇති කඩ කාමරය ලෙස නිවැරදි විය යුතුයි.

සභා වාර්තාවේ තීරණ අංක 05 – 3 යටතේ අප ආයතනයට අයත් කිරම කලාපයේ කඩ කාමර ආදායම් පරීක්ෂක විසින් පරීක්ෂා කරන ලද අතර, එහි වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබෙනවා කියා සඳහන් කර තිබෙනවා. එහි අප ආයතනයට නොව අප සභාවට අයත් කිරම කලාපයේ කඩ කාමර ලෙස සංශෝධනය විය යුතුයි. මේ කරුණු අපි මුල ඉඳලා නිවැරදි කර ගන්න ඕන. නැත්නම් ඉදිරියේදි ගැටළු ඇති වෙනවා.

මහ සභා වාර්තාවේ තීරණ අංක 05 – 13 යටතේ වැසි සමයේ මිද්දෙනිය හුංගම මාර්ගය ජලයෙන් යටවීම පිළිබඳ සඳහන් කර තිබෙනවා. එහිදී ගෙවල් පමණක් නොව නගරයද ජලයෙන් යටවෙනවා. අබේසිංහ පොත් මැදුර ළඟ සභාවේ පොදු ළිඳක් තිබුණා. සභාව සතුව තිබූ අප සිටින කාලයේ නඩත්තු කරන ලද ළිඳක් වහලා තියනවා. අපේ දේපළ වහලා ඔවුන් ඉදි කිරීම් කර ගෙන භුක්ති විඳිනවා. වතුර බැහැගෙන යන්න තිබුණු මාර්ග අවහිර කරලා තිබෙනවා. මේ ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම් කිහිපයක් තිබෙනවා. ඒ පිළිබඳ සභා වාර්තාවට ඇතුළත් විය යුතුයි.

මහ සභා වාර්තාවේ තීරණ අංක 05 – 17 යටතේ වාර්ෂික ස්ථාවර වත්කම් සමීක්ෂණය සම්බන්ධව ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා ස්තුතිය ප්‍රකාශ කර තිබෙනවා. ඇත්තටම ස්තුති කළ යුතුයි. ඒ පිළිබඳ අපි සතුටු වෙනවා. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව භාණ්ඩ සමීක්ෂණය කළ යුතු දෙයක්. හැම වසරකම මේවා සිදු කර තිබෙනවා. මෙම යෝජනාව යටතේ ගරු සභාපතිතුමා පළමු වතාවට කළ සමීක්ෂණයක් නිසා ගැටළු ඇති යනුවෙන් සඳහන් කර තිබෙනවා. නමුත් මෙය පළමු වතාවට නොව ස්ථාවර වත්කම් පිළිබඳ පළමු වතාවට සභාව දැනුවත් කළ වාර්තාවක් ලෙස සඳහන් කළ යුතුයි.

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපේ චන්ද්‍රසේන මන්ත්‍රීතුමා සභා වාර්තාවේ නිවැරදි කිරීම් කිහිපයක් සිදු කළා. න්‍යාය පත්‍රයක සංශෝධන ඉදිරිපත් කිරීමේදී එක් මන්ත්‍රීතුමෙක් කළ යෝජනාවක් සම්බන්ධයෙන් තවත් මන්ත්‍රීතුමෙක්ට සංශෝධන ඉදිරිපත් කළ හැකිද? වෙනත් මන්ත්‍රීතුමෙක් කළ යෝජනාවක් සම්බන්ධයෙන් තවත් කෙනෙක් සංශෝධන ඉදිරිපත් කිරීමේදී රීති ප්‍රශ්නයක් මතු වෙනවා. තමන් කළ දෙයක් පමණයි සංශෝධනය කළ යුතු.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

වාර්තාවේ ඇති කරුණු සම්බන්ධයෙන් එවැනි නිවැරදි කිරීම් කරන්න පුළුවන්.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, රීතිවල කුමන ස්ථානයක එවැනි සඳහනක් තියනවද කියලා මම දන්නෙ නැහැ. යෝජනාව මම ගෙනාවත්, කරුණු මම සාකච්ඡා කළත් , සියළු දෙනාටම සභා වාර්තාවක් ලබා දෙන්නෙ කියවලා බලලා මගේ තියන අඩු පාඩු පෙන්වා දෙන්න. එය පනතෙන් පැවරිලා තියන අයිතියක් සහ සම්ප්‍රදායක්. ඒකයි මම සිදු කලේ.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අංක 18 අනුව බැකෝ යන්ත්‍රයට අවශ්‍ය ටයර් ශානිකා ටයර් හවුස් එකෙන් ලබා ගෙන තිබෙනවා. එහි ස්ථානයක්, ලිපිනයක් සඳහන් කර නැහැ. බැකෝ යන්ත්‍රයේ නඩත්තු කටයුතු මාසයක් තුළ ආයතන කිහිපයකින් සිදු කර තිබෙනවා. එම කමිටු වාර්තාවේ අංක 48 යටතේ කටුවන ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන බූකැන්දයාය ජල මෝටරය අළුත්වැඩියාවට අවශ්‍ය ලෙස සඳහන් කර තිබෙනවා. එහිදී ගන්නා ලද ද්‍රව්‍ය සඳහන් කර නැහැ. සභා වාර්තාව අපිට ලැබුනේ ප්‍රමාද වෙලා. අධ්‍යයනය කරන්න වෙලාවක් නැහැ.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

ගරු මන්ත්‍රීතුමා ශානිකා ටයර් හවුස් තියෙන්නෙ වීරකැටියෙ. බැකෝ යන්ත්‍රය කැඩුණම එකම ගැරේජ් එකකින් අළුත්වැඩියා සිදු කර ගන්න අමාරුයි. ඒ නිසා ආයතන කිහිපයකින් සිදු කර තිබෙනවා. මේ එක මාසයක අළුත්වැඩියා කරන ලද බිල් පමණක් නොව මාස කිහිපයක බිල් තියනවා. මේ පිළිබඳ ගිය සභා වාරයේදිත් කතා කළා. අපේ ඡායා පිටපත් යන්ත්‍රය කැඩී තිබුණු නිසා සභා වාර්තා පිටපත් කර ගන්න ප්‍රමාද වුණා. ඉදිරියේදී ඡායා පිටපත් යන්ත්‍රයක් ගන්නවා. ඒ නිසා ඉදිරියේදී ගැටළුවක් වෙන එකක් නැහැ.

ඉහත සංශෝධනයන්ට යටත්ව 2018 ජුනි මස 21 වන දින වාර්තාව සභා සම්මත කරන ලෙස ගරු සභාපතිතුමා යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

2018 ජුනි මස 21 වන දින මහ සභා වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

ගරු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා අපගේ ආසන සංවිධායක මෙන්ම පොදුජන පෙරමුණේ සංවිධායක ලෙස කටයුතු කළ වී. කේ. ඉන්දික මැතිතුමා අප අතරින් සමු ගත්තා. එතුමාගේ වියෝව වෙනුවෙන් විනාඩි දෙකක නිහඬතාවයකින් ශෝකය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.</u>**

අපිත් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව හැකි අයුරින් ඒ සඳහා සහභාගි වුණා. එතුමාගේ වියෝව වෙනුවෙන් එතුමාගේ පවුලේ අයට කටුවන ප්‍රාදේශීය සභාවේ ශෝකය ලිඛිතව දන්වා යවන ලෙස යෝජනා කරනවා.

ගරු ප්‍රා.ස.ම සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

එතුමාගේ අභාවයේදී මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් උදව් කළා. ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළු දෙනාට අපගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. අපි චන්ද්‍රසේන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි අපගේ ශෝකය ලිඛිතව දන්වා යවමු.

## <u>03. ප්‍රාදේශීය සභාව අමතා එවා ඇති සංදේශ, පෙතත්සම්, පැමිණිලි හා සන්නිවේදන</u> - නැත.

## <u>04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>

## <u>04 – 1. කුඩගොඩ බටහිර ලොට් අංක 493 දරණ ඉඩම සම්බන්ධව.</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අප සභා බල ප්‍රදේශයට අයත් කාරියමඩිත්ත, කුඩගොඩ බටහිර, පාලුවත්ත ලිපිනයේ පදිංචි වයි. ඒ. එන්. ප්‍රියදර්ශන මහතාගේ ලොට් අංක 493 දරණ අක්කර 01 යි රූඩ්. 01 න් යුතු මහගොඩ යාය නැමති ඉඩම තමාට ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. එහිදී එම ඉඩම ලබා දීම සඳහා ආදායම් පරීක්ෂක වාර්තාවක් ලබා ගෙන ඒ අනුව අදාළ නිර්දේශ ලබා දීමට සභාවේ එකඟතාවය ලැබුණි. එහි ඉල්ලන ලද වාර්තාව අද දින සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

මෙම මහගොඩයාය ඉඩම වසර 30 ක පමණ කාලයක සිට වයි. ඒ. එන්. ප්‍රියදර්ශන මහතා භුක්ති විඳින බවත්, ගම්මිරිස්, කොස්, පොල් වැනි භෝග වගා කර ඇති බවත් සඳහන් වෙනවා. මෙම ඉඩම පිළිබඳ වසමෙහි ග්‍රාම නිලධාරීගෙන් විමසීමක් සිදු කර ඇති අතර, ඔහු ප්‍රකාශ කර ඇත්තේ දීර්ඝ කාලයක සිට මෙම ඉඩමේ වගා කටයුතු සිදු කරමින් භුක්ති විඳින බවයි. එමෙන්ම මෙය අනවසර ඉඩමක් බවත්, රජයේ කටයුතු සඳහා වෙන් කර ඇති බවත්ය. තවද මෙම වසමෙහි අනවසර ඉඩම් කැබලි 13 ක් ඇති බවත්, එම ඉඩම්වලින් කිහිපයක්ම රජයේ කටයුතු සඳහා වෙන් කර ඇත යනුවෙන් තිබියදීම එම ඉඩම්වලට 2009 වර්ෂයේ බලපත්‍ර ලබා දී ඇති බව සඳහන් කරන ලදි.

කුඩගොඩ බටහිර හා කුඩගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම්වලට අදාළව කුඩගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ සුසානභූමියක් ඇති අතර, මෙම ඉඩම හැර ප්‍රියදර්ශන මහතා සතුව වෙනත් කිසිදු ඉඩමක් නොමැති බව වාර්තාවේ දක්වා ඇත. මෙම වාර්තාව අනුව වයි. ඒ. එන්. ප්‍රියදර්ශන මහතාට ඔහු භුක්ති විඳින ඉඩම සඳහා බලපත්‍ර ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. කේ. එච්. චන්ද්‍රසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. මෙම වසමට අයත් ඉඩම් කැබලි කිහිපයක් ගිය සභාවාරවලදී දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ලබා දීමට අනුමැතිය ලබා දී තිබෙනවා. දැනටත් එම කොට්ඨාසයේ ඉඩම් කැබලි බදු දෙනවා. මෙම ඉඩම ලබා දීමට සාධාරණ තීරණයක්

ලබා ගැනීම පිළිබඳ අපි සතුටු වෙනවා. ඉඩම සභාවට අවශ්‍යයි කියලා හිතෙනවනම් නැවත ගන්න උනත් පුළුවන්.

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා**

ඉඩම සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මෙම ඉඩම සභාවට අයත් ඉඩමක්ද? සභාව විසින් ඉල්ලන ලද වාර්තාවක් විධිමත්ව ලබා දීම පිළිබඳ අදාළ නිලධාරීතුමියට ස්තුතිවන්ත වෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක්. ග්‍රාම නිලධාරී හා ඉඩම් අයිතිකරු අතර පෞද්ගලික ආරවුලක් නිසා ඉඩම ලබා දීමේදී මේ දක්වා ගැටළු ඇති වී තිබෙනවා. නමුත් ආදායම් පරීක්ෂක වාර්තාව අනුව අපි මෙම ඉඩම බදු පදනම මත ලබා දීම සඳහා අනුමැතිය ලබා දෙමු. ඒ වාගේම ඒ පිළිබඳ කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දන්වා යවමු.

කුඩගොඩ බටහිර ලොට් අංක 493 දරණ ඉඩම වයි. ඒ. එන්. ප්‍රියදර්ශන මහතාට බදු පදනම මත ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 04 – 2. දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ඉඩම් ලබා දීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉඩම් දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ අදාළ ඉඩම් හිමියන්ට ලබා දීම සඳහා සභාවේ එකඟතාවය ලබා දෙන මෙන් ගිය සභා වාරයට ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි. එහිදී එම ඉඩම් පිළිබඳ ආදායම් පරීක්ෂක වාර්තාවක් ලබා ගෙන අදාළ ඉඩම් සම්බන්ධව නිර්දේශ ලබා දීමට සභාවේ එකඟතාවය ලැබී ඇත. ඒ අනුව අදාළ ඉඩම් පිළිබඳ ආදායම් පරීක්ෂක වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මෙම වාර්තාව පිළිබඳ සලකා බැලීමේදී ජනතාව වගා කටයුතු සිදු කර ගෙන යන ඉඩම් බව පැහැදිලි වෙනවා. ඒ නිසා මෙම ඉඩම් අදාළ ඉඩම් හිමියන් සඳහා දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

| අනු අංකය | වසම | නම | ලිපිනය | ඉඩමේ ස්වභාවය |
|---|---|---|---|---|
| 01 | කැබැල්ලකැටිය | වඩුදෙනිය ගමාච්චිගේ ජයවර්ධන | ජයගිරි, කැබැල්ලකැටිය, කිරම | පදිංචි ඉඩමකි |
| 02 | කැබැල්ලකැටිය | වඩුදෙනිය ගමාච්චිගේ ජයවර්ධන | ජයගිරි, කැබැල්ලකැටිය, කිරම | කුරුඳු ඉඩම |
| 03 | කැබැල්ලකැටිය | ඉන්ද්‍රානි ඇහැලආරච්චි | කැබැල්ලකැටිය, කිරම | කුරුඳු ඉඩම |
| 04 | කැබැල්ලකැටිය | තිබ්බෙටුවාවගේ ගමාච්චිගේ සිරිපාල | නාරංදෙනියහේන, හඳුගල, මාතර | කුරුඳු ඉඩම |

| | | | | |
|---|---|---|---|---|
| 05 | කැබැල්ලකැටිය | තිබ්බෙටුවාවගේ ගමාච්චිගේ සිරිපාල | නාරංදෙනියහේන, හඳුගල, මාතර | කුරුඳු ඉඩම |
| 06 | කැබැල්ලකැටිය | කුලප්පු ලියන ආරච්චිගේ ලීලාවතී | වැලිපොත, කැබැල්ලකැටිය, කිරම | කුරුඳු, පොල් ඉඩම |
| 07 | කැබැල්ලකැටිය | ජේමසිරි වික්‍රමසිංහ | කැබැල්ලකැටිය, කිරම | කුරුඳු ඉඩම |
| 08 | කැබැල්ලකැටිය | අබේවර්ධනගේ ගරුහාමි | රත්න සෙවන, කැබැල්ලකැටිය, කිරම | කුරුඳු ඉඩම |
| 09 | කැබැල්ලකැටිය | ජාතුංආරච්චිගේ චන්ද්‍රලතා | කැබැල්ලකැටිය, කිරම | කුරුඳු ඉඩම |
| 10 | කැබැල්ලකැටිය | රංජිත් මල්ලවආරච්චි | 268/ඒ, කැබැල්ලකැටිය | කුරුඳු ඉඩම |
| 11 | කැබැල්ලකැටිය | ලියනගේ ඥානවතී | කැබැල්ලකැටිය, කිරම | වගා ඉඩම |
| 12 | කැබැල්ලකැටිය | රංජිත් මල්ලවආරච්චි | 268/ඒ, කැබැල්ලකැටිය | වගා ඉඩම |
| 13 | කැබැල්ලකැටිය | ගුණසේන ආරච්චිගේ චුල්ලසේන | කැබැල්ලකැටිය, කිරම | වගා ඉඩම |
| 14 | කැබැල්ලකැටිය | ගුණසේන ආරච්චිගේ චුල්ලසේන | කැබැල්ලකැටිය, කිරම | වගා ඉඩම |
| 15 | කැබැල්ලකැටිය | මල්ලව ආරච්චිගේ සුනිල් | සංහළී, කැබැල්ලකැටිය, කිරම | කුරුඳු ඉඩම |
| 16 | කැබැල්ලකැටිය | ලොකුකැටියපේගේ ඥානවතී | ගැමුණු, ඉලුක්කැටියහේන, කැබැල්ලකැටිය, කිරම | වගා ඉඩම |
| 17 | කැබැල්ලකැටිය | ලොකුකැටියපේගේ ඥානවතී | ගැමුණු, ඉලුක්කැටියහේන, කැබැල්ලකැටිය, කිරම | වගා ඉඩම |
| 18 | කැබැල්ලකැටිය | ලොකුකැටියපේගේ ඥානවතී | ගැමුණු, ඉලුක්කැටියහේන, කැබැල්ලකැටිය, කිරම | වගා ඉඩම |
| 19 | කැබැල්ලකැටිය | විදාන පතිරණගේ ලුක්ෂන් | 119 බී, සපුතන්ත්‍රිකන්ද, රම්මල | වගා ඉඩම |
| 20 | කැබැල්ලකැටිය | දෙනියවත්ත කම්කානම්ගේ සිරිල් | නෙත්මි, පිස්සුබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 21 | කැබැල්ලකැටිය | ගමගේ දයාවතී | දෙඹුවල, කැබැල්ලකැටිය, කිරම | කුරුඳු ඉඩම |

| | | | | |
|---|---|---|---|---|
| 22 | දෙහිගහහේන | තිබ්බොටුවාව දෙනිය කම්කානම් ආරච්චිගේ අනුලා කාන්ති | 183, දෙහිගහහේන, හඳුගල | කුරුඳු ඉඩම |
| 23 | එගොඩබැද්ද | සේනානායක යාපාගේ සෝමාවතී | ගිරුවායෙ ගෙදර, කිරම | කුඹුරු ඉඩම |
| 24 | එගොඩබැද්ද | ඉඹුලහිටිය ගමාච්චිගේ චන්ද්‍රදාස | කුසුම්, කැකිරිඹබඩ , කිරම | කුරුඳු ඉඩම |
| 25 | එගොඩබැද්ද | කෝංගල මයිනාක්කුගේ තිලකලතා | නො. 04, 02 වන පටුමග, හක්මන පාර, වලස්මුල්ල | කුරුඳු ඉඩම |
| 26 | එගොඩබැද්ද | ලියන ආරච්චිගේ ඥානවතී | යමගේ වත්ත, පිස්සුබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 27 | කැබැල්ලකැටිය | දෙනියවත්ත කම්කානම්ගේ සිරිල් | නෙත්මි, පිස්සුබැද්ද, කිරම | වගා ඉඩම |
| 28 | දෙහිගහහේන | තිබ්බොටුවාව දෙනිය කම්කානම් ආරච්චිගේ අනුලා කාන්ති | 183, දෙහිගහහේන, හඳුගල | වගා ඉඩම |
| 29 | කැබැල්ලකැටිය | ගමගේ දයාවතී | දෙඩුවල, කැබැල්ලකැටිය, කිරම | වගා ඉඩම |
| 30 | එගොඩබැද්ද | ගමගේ ජයතිලක | ලක්මිණි, කැකිරිඹබඩ, කිරම | පදිංචි ඉඩමකි |
| 31 | එගොඩබැද්ද | ගමගේ ජයතිලක | ලක්මිණි, කැකිරිඹබඩ, කිරම | කුරුඳු ඉඩම |
| 32 | එගොඩබැද්ද | යාපා වීරසිංහ රත්නායක ධර්මසේන | රත්නවාස, කැකිරිඹබඩ, කිරම | කුරුඳු ඉඩම |
| 33 | එගොඩබැද්ද | වඩුදෙනිය ගමාච්චිගේ ජයවර්ධන | ජයගිරි, කැබැල්ලකැටිය, කිරම | කුරුඳු ඉඩම |
| 34 | එගොඩබැද්ද | වික්‍රමසිංහ කංකානම්ගේ පීටර් | කෝන්ගහකොරටුව, එගොඩබැද්ද | ගොරකා, කුරුඳු ඉඩම |
| 35 | එගොඩබැද්ද | ගුණසේන ආරච්චිගේ චුල්ලසේන | ගුණසේකර නිවස, කැබැල්ලකැටිය | කුරුඳු ඉඩම |
| 36 | එගොඩබැද්ද | වඩුදෙනිය ගමාච්චිගේ දයාරත්න | තිලක්, වඩුදෙනිය, කිරම | පදිංචි ඉඩම |
| 37 | එගොඩබැද්ද | ගමාච්චිගේ ජිනසේන | චාමර, වඩුදෙනිය, කිරම | කුරුඳු ඉඩම |

| | | | | |
|---|---|---|---|---|
| 38 | එගොඩබැද්ද | ඉඹුලහිටිය ගමාච්චිගේ චන්ද්‍රදාස | කුසුම්, කැකිරිඔබඩ , කිරම | කුරුඳු ඉඩම |
| 39 | එගොඩබැද්ද | වඩුදෙනිය ගමාච්චිගේ දිනිත් නිලක්ෂිත | 2/96, බක්මීවල මාවත, පල්ලෙකන්ද පාර, වලස්මුල්ල | කුරුඳු ඉඩම |
| 40 | එගොඩබැද්ද | වඩුදෙනිය ගමාච්චිගේ චන්ද්‍රපාල | කම්බිකොරටුව, වේළුවනාරාම පාර, වේරදූව, මාතර | කුරුඳු ඉඩම |
| 41 | එගොඩබැද්ද | අබේතුං කංකානම් ගමාච්චිගේ ප්‍රේමතිලක | ජයමිණ, බෙලිගහවත්ත, වීරකැටිය පාර | කුඹුරු ඉඩම |
| 42 | එගොඩබැද්ද | යද්දෙහිගේ රූපා චාන්දනී | චන්දන, එගොඩබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 43 | එගොඩබැද්ද | වඩුදෙනිය ගමාච්චිගේ පද්මලතා | 4/36, අරුණ, දම්පලාගෙ ගෙදර, කැටියපේ, දෙයියන්දර | කුරුඳු ඉඩම |
| 44 | එගොඩබැද්ද | දන්දෙනිය ආරච්චිගේ විමලාවතී | එගොඩහහේන, එගොඩබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 45 | එගොඩබැද්ද | දන්දෙනිය ආරච්චිගේ විමලාවතී | එගොඩහහේන, එගොඩබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 46 | එගොඩබැද්ද | වඩුදෙනිය ගමාච්චිගේ සිරිසේන | හඳුගල පාර, වඩුදෙනිය, කිරම | කුරුඳු ඉඩම |
| 47 | එගොඩබැද්ද | ජාලත් තන්ත්‍රිගේ බේබිහාමි | උඩ කොරටුව, පිස්සුබැද්ද, කිරම | පදිංචි ඉඩමකි |
| 48 | එගොඩබැද්ද | කෝංගල මයිනාක්කුගේ තිලකලතා | වීරවාස, මඩකඩිත්තහේන, කැකිරිඔබඩ කිරම | කුරුඳු ඉඩම |
| 49 | හඳුගල | තිබ්බොටුවාව ගමාච්චිගේ සිරිසේන | සරසවි නිවස, හඳුගල, මාතර | රක්ෂිතය සඳහා වෙන් වූ ඉඩමකි |
| 50 | හඳුගල | හෙට්ටි ආරච්චි ගමගේ බුද්ධදාස | තරිඳු ස්ටෝර්ස්, හඳුගල | වගා ඉඩමකි |
| 51 | සපුතන්ත්‍රිකන්ද | ජයලත් සමරනායකගේ තුෂාර දිලිප් කුමාර | ඉරුෂි නිවස, සපුතන්ත්‍රිකන්ද | වගා ඉඩමකි |
| 52 | සපුතන්ත්‍රිකන්ද | ගමාච්චිගේ දයාරත්න | ප්‍රසාදිනී, සපුතන්ත්‍රිකන්ද, රම්මල | වගා ඉඩමකි |

| | | | | |
|---|---|---|---|---|
| 53 | සපුතන්ත්‍රිකන්ද | ජාලත් තන්ත්‍රිගේ ජයදාස | ජයලත් නිවස, ඩිස්පැන්සරිය අසල, රම්මල | වගා ඉඩමකි |
| 54 | සපුතන්ත්‍රිකන්ද | ජාලත් සමරසේකරගේ ප්‍රේමචන්ද්‍ර | 119/බී, 1, සෙව්වන්දි, සපුගහදොළ, රම්මල | වගා ඉඩමකි |
| 55 | රම්මල | දුනුහීන්ගේ ගරුසිංහ | අංක 41, 2 පියවර, රම්මල, වරාපිටිය | වගා ඉඩමකි |
| 56 | මාපිටකන්ද | රණමුබගේ පියරත්න | ලක්සෙවන, ගෙවල් විස්ස අසල | වගා ඉඩමකි |
| 57 | බටගස්ස | ගාර්දි මුල්ලගේ නිහාල්චමින්ද | තණබිම, බටගස්ස | වගා ඉඩමකි |
| 58 | පහලවත්ත | සරඹගේ නිමල් සිරි | මුල්ලෙ, අතුරු පහළ වත්ත, කිරම | වගා ඉඩමකි |
| 59 | පහලවත්ත | තුෂාරි නිල්මිණී කුමාරි | එගොඩබැද්ද හංදිය, පහළවත්ත, කිරම | වගා ඉඩමකි |
| 60 | පහලවත්ත | බාලගේ සෝමසිරි | 19 සී 4, ප්‍රජා ශාලාව පාර, පහලවත්ත. | වගා ඉඩමකි |
| 61 | පිස්සුබැද්ද | රණසිං ලියනගේ මහින්ද | බොරෝල්ලහේන, පිස්සුබැද්ද | කුරුඳු ඉඩම |
| 62 | පිස්සුබැද්ද | රණසිංහ ලියනගේ ඉන්දික | පිස්සුබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 63 | පිස්සුබැද්ද | මතුවකන්දගේ සිරිසේන | සුවමාලි, පිස්සුබැද්ද | කුරුඳු ඉඩම |
| 64 | පිස්සුබැද්ද | රණසිං කළුමැදිරියගේ ජයවර්ධන | රණ ශ්‍රී, පිස්සුබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 65 | පිස්සුබැද්ද | රණසිං කළුමැදිරියගේ ජයවර්ධන | පිස්සුබැද්ද, කිරම | පදිංචි ඉඩම |
| 66 | පිස්සුබැද්ද | රණසිං ලියනගේ ගුණදාස | බටේහේන, පිස්සුබැද්ද | කුරුඳු ඉඩම |
| 67 | පිස්සුබැද්ද | ජාලත් තන්ත්‍රිගේ බේබිහාමි | මුංහේන, පිස්සුබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 68 | පිස්සුබැද්ද | රණසිං කළුමැදිරියගේ ජයවර්ධන | පිස්සුබැද්ද, කිරම | කුරුඳු ඉඩම |

| | | | | |
|---|---|---|---|---|
| 69 | පිස්සුබැද්ද | හෙට්ටිආරච්චිගේ සමන් කුමාර | ගල්වලහේන, පිස්සුබැද්ද | කුරුඳු ඉඩම |
| 70 | පිස්සුබැද්ද | අබේසිංහගේ පර්සි රංජිත් | නදුන්කැටිය. පිස්සුබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 71 | පිස්සුබැද්ද | අබේසිංහගේ ගුණදාස | දෙයියන්දර ගෙදර. පිස්සුබැද්ද | කුරුඳු ඉඩම |
| 72 | පිස්සුබැද්ද | අබේසිංහගේ ලීලාවතී | දෙයියන්දර ගෙදර, පිස්සුබැද්ද, කිරම | කුරුඳු ඉඩම |
| 73 | පිස්සුබැද්ද | අබේසිංහගේ ශ්‍රියාලතා | නැදුන්හේන, පිස්සුබැද්ද, කිරම | වගා ඉඩම |
| 74 | පිස්සුබැද්ද | අබේසිංහගේ ප්‍රභාත් චන්දන | දෙයියන්දර ගෙදර. පිස්සුබැද්ද | කුරුඳු ඉඩම |
| 75 | පිස්සුබැද්ද | ගමාච්චිගේ ගුණපාල | හීන් ඇල වත්ත, පිස්සුබැද්ද | පදිංචි ඉඩමකි |
| 76 | පිස්සුබැද්ද | දෝන ප්‍රැන්සිනා | නැදුන්කැටිය, පිස්සුබැද්ද | කුරුඳු ඉඩම |
| 77 | පාතෙගම | වීරසිංහගේ අරුණ බුද්ධික | මිල්ලගහවත්ත, පාතේගම, රම්මල | වගා ඉඩම |
| 78 | පාතෙගම | ගමගේ කීර්තිරත්න | තෙල් මෝල, පාතේගම, රම්මල | වගා ඉඩම |
| 79 | පාතෙගම | ගමගේ ගුණරත්න | ආරච්චිගොඩ, රම්මල | වගා ඉඩම |
| 80 | පාතෙගම | අංගුන්න ගමගේ රෝහණ රංගජීව | දෙමටකැටිය, පාතේගම, රම්මල | වගා ඉඩම |
| 81 | පාතෙගම | ගමගේ කුලරත්න අබේවික්‍රම | ප්‍රසාදි, දෙහිගහහේන පාර, පාතේගම | වගා ඉඩම |
| 82 | පාතෙගම | ගමගේ කුලරත්න අබේවික්‍රම | ප්‍රසාදි, දෙහිගහහේන පාර, පාතේගම | වගා ඉඩම |

ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා</u>**

මිද්දෙනිය ආදායම් පරීක්ෂක ලබා දුන්නා වාගේ වාර්තාවක් කිරම ආදායම් පරීක්ෂක ලබා දී නැහැ. අඩුම තරමේ වාර්තාවේ අත්සනක් නැහැ. ඉඩම් පිළිබඳ සවිස්තර වාර්තාවක් මෙහි දක්වා නැහැ. දෙදෙනාම එකම රාජකාරිය සිදු කරන්නෙ. වාර්තා දෙකෙහි ලොකු වෙනසක් තියනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

කිරම ආදායම් පරීක්ෂක විද්‍යුත් තැපැල මඟින් මෙම වාර්තාව අපට යොමු කර තිබෙනවා මොකද මෙම සභා වාරයට ඉදිරිපත් කරන්න අවශ්‍ය නිසා ඉක්මනට වාර්තාව ලබා ගන්න වුනා. ඒ නිසා අත්සන ගන්න ක්‍රමයක් නැහැ. නමුත් පසුව එතුමියගේ අසතන සහිතව මෙම වාර්තාව අපිට ලැබී තිබෙනවා. එමෙන්ම එතුමියට ලොකු ඉඩම් ප්‍රමාණයක් බලන්න තිබුනා.

**ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.**

මෙහි බොහෝ ඉඩම් කැබලි එකම අයෙකුට තියනවා. රජයේ ඉඩම් ලබා දෙන ප්‍රතිපත්තියක් ඇති. පසුගිය කාලයේ ඇති වූ ගංවතුර. නායයෑම් වැනි හදිසි ආපදා කාලවලදී හඳුගල වැනි ප්‍රදේශවල අවතැන් වූ ජනතාවට ලබා දෙන්න වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ඉඩම් තිබුණේ නැහැ. මෙම ඉඩම්වල ප්‍රමාණය අපි දන්නෙ නැහැ. හදිසි අවස්ථාවක් වුවහොත් ඒවටත් වෙන් කර ඉඩම් ලබා දෙන්න පුළුවන්නම් හොඳයි. වගා ඉඩම් බොහෝමයක් තියෙන්නෙ. පදිංචි ඉඩම් තියෙන්නෙ පොඩි ප්‍රමාණයක්. එම නිසා අනුමැතිය ලබා දෙන විට අපගේ කොන්දේසි යොදා අනුමැතිය ලබා දෙන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මෙම ඉඩම්වල ලොකු ප්‍රමාණයක් නැහැ. අක්කර කාල, භාගය වගේ පොඩි ප්‍රමාණයන් තියෙන්නෙ. මමත් පෞද්ගලිකව දන්න ඉඩම් මෙහි තියනවා. ප්‍රාදේශීය ලේකම්ට ඕන වෙලාවක මෙම ඉඩම් නැවත ගන්න පුළුවන්. පදංචි ඉඩම් කිහිපයක් පමණයි තිබෙන්නේ. බොහෝ ඉඩම්වල දීර්සකාලීන භෝග වගා කර තිබෙනවා. ඉඩම්වල පූර්ණ අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු නිසා ගැටළුවක් නැහැ. එම නිසා මෙම ඉඩම් අදාළ ඉඩම් හිමියන්ට ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්ට දන්වා යවමු.

වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් අදාළ ඉඩම් හිමියන්ට ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා.

## 05 – 1. දීර්සකාලීන බදු පදනම මත ලබා දී ඇති මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 01 සිට 08 දක්වා වූ කඩ කාමර සම්බන්ධව.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ මහජන බැංකුව පවත්වා ගෙන යනු ලබන වර්ග අඩි 2092 ක බිම් ප්‍රමාණයෙන් යුත්ත වූ ( එනම් අංක 01 – 08 දක්වා ) ගොඩනැගිලි කොටස දීර්සකාලීන බදු පදනම මත මහජන බැංකුව වෙත ලබා දී ඇත. එම බදු ගිවිසුමේ කාලය 2018.12.04 දිනෙන් අවසන් වේ. බදු කාලය නැවත වසර 10 ක් දීර්ඝ කර ගැනීම සඳහා 2018.04.24 දින මහජන බැංකුව අපගෙන් ඉල්ලීමක් සිදු කර ඇත. මේ සඳහා සභා පිහිටුවීමට පෙර පළාත් පාලන කොමසාරිස් තුමාගේ උපදෙස් ඉල්ලා ඇති අතර, ඒ සඳහා පහත සඳහන් ලිපි ලේඛන ඉල්ලා ඇත.

1. මුදල් හා ප්‍රතිපත්ති කමිටු නිර්දේශය.
2. ලේකම්ගේ තීරණය.
3. අනුමැතිය ලබා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත.
4. විධිමත්ව සැකසූ බදු ගිවිසුම.
5. පැවරුම් නියෝගයේ පිටපත.

6. තක්සේරු වාර්තාව.

මෙහිදී අංක 01 හා 02 යටතේ ඉදිරිපත් කර ඇති කරුණු වෙනුවට සභා අනුමැතියක් ලබා ගත යුතුවේ. ඒ අනුව මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 01 සිට 08 දක්වා වූ කඩ කාමර නැවත වසර 10 ක් සඳහා පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ උපදෙස් හා චක්‍රලේඛ පරිදි විධිමත්ව සැකසූ ගිවිසුමකට අනුව ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා.**

අදාළ ක්‍රම වේදයට අනුව ගිවිසුම ගතවෙන්න.

**ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.**

පසුගිය කාලයේ ගිවිසුම්ගත වූ අපේ බදු ගිවිසුම්වල බොහෝ අඩු පාඩු තිබෙනවා. මහජන බැංකුව සමඟ ගිවිසුමට එළඹෙන විට ඒ සභාවේ අපිත් සිටියා. ඒ අවස්ථාවේ අපි ඉක්මන් වුණා වැඩියි. අපිට පොළ හදන්න ඉඩම ගන්න මුදල් අවශ්‍ය වුණා. ඒ වාගේම බැංකුවට මේක ගන්න අවශ්‍ය වුනා. සභාව කොපමණ කරුණු කාරණ පෙන්වා දුන්නත් බැංකුව කියන හැම කොන්දේසියකටම යටත් වෙලා බැංකුව විසින් හදපු ගිවිසුමකට අත්සන් කළා. දැන් කලබල වෙන්න අවශ්‍ය නැහැ. බැංකුව කොහෙවත් ගෙන යන්නෙ නැහැ. එබැවින් ඉදිරියේදී අපි හදන ගිවිසුමකට, රජයේ තක්සේරුව අනුව මුදල් ලබා ගෙන ගිවිසුම් ගත වෙන්න. විමර්ෂන නිලධාරීන් සම්බන්ධ කර ගෙන අපිට අවශ්‍ය විදියට අපිට වාසි වන ලෙස අපි ගිවිසුම් හදන්න ඕන. ගිවිසුම සකස් කර සභාවට ඉදිරිපත් කර සභාවේ එකඟතාවය ලබා ගන්න අවශ්‍යයි.

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා**

මෙම ගිවිසුම්ගත වීම අවුරුදු තුනකට වගේ වුණා නම් හොඳයි. පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ විමසීමකින් තොරව අවුරුදු තුනකට සභා සම්මතයක් ලබා ගෙන බදු දෙන්න පුළුවන්. පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා දීම සඳහා කරුණු 06 සභා අනුමැතියට යොමු කර තිබෙනවා. එහිදී මුදල් හා ප්‍රතිපත්ති කමිටු නිර්දේශය හා ලේකම්ගේ තීරණය සඳහා අනුමැතිය ඉල්ලා තිබෙනවා. ඒ වාගේම ගිවිසුමත් සභාවට යොමු කර අනුමැතිය ලබා ගත්තා නම් හොඳ නැද්ද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

සභාව පිහිටුවන්න පෙර මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු තීරණය හා ලේකම්ගේ තීරණය අළුශ්‍ය වුණා. නමුත් සභාව පිහිටුවීමෙන් පසු මෙම තීරණ දෙක වෙනුවට සභා තීරණය අනුමැතිය සඳහා යැවිය යුතුයි. මෙම කරුණු සභාව දැනුවත් වීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අපි මහජන බැංකුව සඳහා අවුරුදු 10 ට අංක 01 සිට 08 දක්වා වූ කඩ කාමර අදාළ චක්‍රලේඛ පදනම් කර ගනිමින් අප විසින් සකස් කරන ලද ගිවිසුමකට අනුව තක්සේරු වර්තාව අනුව දීර්සකාලීන බදු පදනම යටතේ ලබා දෙමු. එහිදී පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමු. පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි නව ගිවිසුම සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන මහජන බැංකුව සඳහා අවුරුදු 10 ට අංක 01 සිට 08 දක්වා වූ කඩ කාමර බදු දීම සිදු කරමු.

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 01 සිට 08 දක්වා වූ කඩ කාමර මහජන බැංකුව සඳහා නැවත වසර 10 ක් දීර්සකාලීන බදු පදනම මත ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකතමිකව සභා සම්මත විය.

## 05 – 2. අභ්‍යන්තර විගණන සැලැස්ම - 2018

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

2018 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය සඳහා අප සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් පහත සඳහන් අංශ ආවරණය කරමින් විගණන සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවා. එම සැලැස්ම අනුව අප විසින් කරන ලද රාජකාරි කටයුතු සිදු කිරීමේදී නිවැරදි විය යුතු ස්ථාන, අතපසු වන රාජකාරී කටයුතු ආදීය පෙන්වා දෙනු ලබනවා. ඒවා නිවැරදි කර ගෙන සාර්ථක සභාවක් මගින් සාර්ථක සේවයක් ජනතාවට ලබා දීමට හැකියාව ලැබෙනවා. එම නිසා මෙම ඉදිරිපත් කර ඇති අභ්‍යන්තර විගණන සැලැස්ම සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

01. ගෙවීම් වවුචර. 02. හිඟ ආදායම්. 03.ගෙවිය යුතු ශේෂයන්. 04.ක්ෂේත්‍ර රාජකාරී.
05.සරප් රාජකාරී. 06.බැංකු ශේෂය. 07.වාහන පරිපාලනය. 08.අත්තිකාරම්.

09.අය - වැය. 10.ස්ථාවර වත්කම්.

ගරු. ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. එවැනි විගණනයක් සිදු කිරීම ගොඩක් හොඳයි.

2018 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අභ්‍යන්තර විගණන සැලැස්ම පිළිබඳ විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 3. දසමස් වැටුප් අත්තිකාරම් මුදල් ලබා දීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අප සභාවේ සේවයේ නියුතු පුස්තකාල සහායක කේ. ඒ. ජනත් මදූෂ රත්නායක මහතාට සභාව විසින් ලබා දෙන දසමස් වැටුප් අත්තිකාරම් මුදල් පොරොත්තු ලේඛනය අනුව ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

කේ . ඒ. ජනත් මදූෂ රත්නායක මහතාට සභාව විසින් ලබා දෙන දසමස් වැටුප් අත්තිකාරම් මුදල් පොරොත්තු ලේඛනය අනුව ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 4. මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 13 කඩ කාමරය සම්බන්ධව.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 13 කඩ කාමරය ගල්පොත්තයාය පදිංචි එස්. ජයතිස්ස මහතා විසින් බදු පදනම මත ලබා ගෙන ඇත. එහි කීමණි මුදල රු. 1600000.00 කි. එම මුදල එකවර ගෙවීමට නොහැකි බැවින් 2017.12.15 දිනැති ඔහුගේ ඉල්ලීම් ලිපිය අනුව දපස/පපකො/2010/01 චක්‍රලේඛය පරිදි මාස 06 ක කාලයක් ලබා දී ඇත. එම සහන කාලය 2018.06.15 දිනෙන් අවසන් වී ඇති අතර, ඒ වන විට අදාළ කීමණි මුදලෙන් රු.833333.33 ක් ගෙවා අවසන් කර ඇත.

එමෙන්ම රු.766666.67 ක හිඟ කීමණි මුදලක් ගෙවීමට ඉතිරිව ඇත. එම හිඟ මුදල ගෙවීම සඳහා නැවත සහන කාලයක් ලබා දෙන මෙන් ඔහු ඉල්ලීම් කර ඇත. නමුත් චක්‍රලේඛ අනුව ලබා දී ඇති සහන

කාලය අවසන් බැවින් සභාව විසින් ඔහුට සහන කාලයක් ලබා දෙන්න පුළුවන්නම් ලබා දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ගාමිණී ජයවික්‍රම මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා.</u>**

සහන කාලය ඇතුළත මුදල් ගෙවීම සතුටුදායකද?

**<u>ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා.</u>**

සහන කාලය ඇතුළත ගෙවන්න කියන්න. නැත්තනම් නැවත නැවත සහන කාලයක් ලබා දෙන්න වෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ගාමිණී සංජීව මැතිතුමා.</u>**

මාස තුනක සහන කාලයක් ලබා දෙන්න. නැවත සහන කාලයක් ඉල්ලන්න එපා කියන්න.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

චක්‍රලේඛ අනුව අපි මාස 06 ක කාලයක් ලබා දී තිබුණා. එම කාලය ඇතුළත ගෙවීමට ඇති කීමණී මුදලෙන් භාගයක් පමණ ගෙවා තිබෙනවා. නමුත් චක්‍රලේඛ අනුව නැවත සහන කාලයක් ලබා දෙන්න අපිට බැහැ. ඒ පිළිබඳ අදාළ කඩ හිමියාට දන්වා යවන්න කියමු. එබැවින් ඉතිරි කීමණී මුදල් ගෙවන්න කියමු.

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 13 කඩ කාමරයේ ඉතිරි කීමණී මුදල් ගෙවීම සඳහා සහන කාලයක් ලබා දී ඇති බැවින් නැවත සහන කාලයක් ලබා නොදීමටත්, ඉතිරි කීමණී මුදල් ගෙවන ලෙස අදාළ කඩ හිමියාට දන්වා යැවීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 5. මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ ඇති අංක 13 කඩ කාමරයේ අඩු පාඩු සකස් කිරීම.</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 13 කඩ කාමරයේ විදුලිය හා ජලය මේ වන විට අක්‍රිය කර ඇත. එමෙන්ම එහි ඉදිරිපස දොර වැසීමට නොහැකි නිසා අළුත්වැඩියා කළ යුතුය. එමෙන්ම තම ව්‍යාපාරය කර ගෙන යාම සඳහා ඇතුළත කොටු කර ඇති කොටස හා කෙටි බැම්ම ඉවත් කර දෙන ලෙස කඩහිමියා ඉල්ලීම් කර ඇත. මෙම අඩු පාඩු සකස් කිරීම සඳහා තාක්ෂණික නිලධාරී භාරහා වාර්තාවක් හා අදාළ අළුත්වැඩියා කටයුතු සඳහා වන ඇස්තමේන්තුවක් ලබා ගෙන ගිවිසුම අනුව එම කටයුතු සිදු කිරීමටත්, ජලය හා විදුලිය ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ටී. ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා.</u>**

එම කඩ කාමරයේ විදුලිය, ජලය අක්‍රිය කිරීමට හේතුව කුමක්ද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මාළු වෙළඳසැල මීට පෙර එම ස්ථානයේ පවත්වා ගෙන ගියා. ඔවුන් බිල් ගෙවලා නැහැ. අපි මෙම කඩ කාමරය ටෙන්ඩර් කර මොහුට ලබා දී තිබෙනවා.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.**

එම කඩ කාමරයේ මීට පෙර ධීවර වෙළඳ සැල පවත්වා ගෙන ගියා. ඔවුන් බිල්පත් ගෙවා නැතිව ඇති. ඒ නිසා ජල හා විදුලි සැපයුම අත්සිටුවා ඇති. ඒ නිසා ඔවුන්ට ගෙවන්න වෙනවා.

**ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.**

ධීවර අමාත්‍යංශයේ වෙළඳසැලක් එම කඩ කාමරයේ පවත්වා ගෙන ගිය නිසා ඔවුන්ගෙන් අය කර ගත යුතු හිඟ බිල්පත් තියනව නම් ඒවා අය කර ගන්න. අපි මේ කඩ කාමරවලින් බදු අය කරනව නම් ඔවුන්ට අවශ්‍ය පහසුකම් අපි ලබා දෙන්න ඕන. අදාළ කඩ කාමරය ව්‍යාපාරය කර ගෙන යාමට අවශ්‍ය ලෙස සකස් කර දෙන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මුලින්ම මෙම කඩ කාමරයේ ධීවර වෙළඳසැල පවත්වා ගෙන ගියා. නව තක්සේරු වාර්තාව අනුව තක්සේරු මුදල වැඩි වුණා. ගෙවිය යුතු බදු මුදල වැඩි නිසා තක්සේරු මුදල අඩු කර දෙන ලෙස ඔවුන් ඉල්ලීම් කර තිබුණා. නමුත් එය සිදු නොවූ නිසා එම ස්ථානයෙන් කඩ කාමරය ඉවත් කර ගෙන තිබෙනවා. නමුත් එහි ජලය හා විදුලිය සඳහා වන හිඟ බිල්පත් අය කර ගන්න තිබෙනවා. එම බිල්පත් ගෙවන ලෙස අපි ධීවර අමාත්‍යංශයෙන් ඉල්ලීමක් සිදු කරමු. අපි කඩ කාමරය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ජලය හා විදුලිය ලබා දීමට කටයුතු සිදු කරමු. කඩ කාමරයේ දොර සකස් කිරීමට හා අනෙකුත් අඩු පාඩු තාක්ෂණික නිලධාරී වාර්තාව හා ඇස්තමේන්තු අනුව සිදු කරමු. මෙම අළුත්වැඩියා කටයුතු ගිවිසුම පරිදි සිදු කරමු.

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 13 කඩ කාමරයේ හිඟ ජල බිල්පත් හා විදුලි බිල්පත් ධීවර අමාත්‍යංශයෙන් අය කර ගැනීමටත්, දොර හා අනෙකුත් අළුත්වැඩියා කටයුතු තාක්ෂණික නිලධාරී වාර්තාවක් ලබා ගෙන ගිවිසුම අනුව කටයුතු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 6. ගඟුලන්දෙනිය ග්‍රාම නිලධාරී වසමට අයත් අඹගස්මුල්ල මාර්ගය

## අළුත්වැඩියා කිරීම.

**ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය**

රිටිගහයාය කොට්ඨාසයේ ගඟුලන්දෙනිය ග්‍රාම නිලධාරී වසමේ අඹගස්මුල්ල මාර්ගය ජනතාවට ගමන් කිරීමට අපහසු තත්ත්වයේ පවතී. කිලෝ මීටර් එකක් පමණ ගමන් කිරීමට අපහසු තත්ත්වයෙන් පවතී. එබැවින් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි මෙම මාර්ගය පිළිබඳ තාක්ෂණික නිලධාරී මඟින් ඇස්තමේන්තුවක් සකස් කර සභා අරමුදල් යොදවා ප්‍රතිසංස්කරණය කර දෙන්නම්. අප කොට්ඨාස 17 හිම සියළු අංශයන් පිළිබඳ අවධානය යොමු කර සංවර්ධන වැඩසටහනක් සංවිධානය කර තිබෙනවා. එහිදී මෙම මාර්ගයත් සකස් කර දෙන්න පුළුවන්.

ගඟුලන්දෙනිය ග්‍රාම නිලධාරී වසමට අයත් අඹගස්මුල්ල මාර්ගය සභා අරමුදල් යොදවා අළුත්වැඩියා කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 7. තල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ වීථි ලාම්පු සවි කිරීම.

**ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය**

තල්වත්ත ග්‍රාම නිලධාරී වසමට අයත් පහත සඳහන් ස්ථානවල වීථි ලාම්පු සවි කළ යුතු යැයි යෝජනා කරමි.

- තල්වත්ත පාරේ කහඹිලිය පොළ පාරට හැරෙන මංහංදිය
- කුඩගල්කැටිය හංදිය
- තල්වත්තේ බෝක්කුව අසලට ( ඇඩ්වින් මහතාගේ නිවස ඉදිරිපිට )
- තල්වත්තේ පාසල අසලට.

ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සිරිසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි මේ වන විට වීථි පහන් අළුත්වැඩියාව සඳහා වීථි ලාම්පු උපකරණ ලබා ගෙන තිබෙනවා. ඒ අනුව ඉදිරි සතිවල වීථි ලාම්පු සවි කිරීම් සිදු කරනවා.

තල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ සඳහන් කර ඇති ස්ථානවලට වීථි ලාම්පු සවි කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 8. උඩගොමඩිය හස්පීගල ඇහැලගහ හේන මාර්ගය හරහා ගලා බසින වැසි ජලය නිසා නිවෙස්වලට සිදුවන හානිය සම්බන්ධව.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

කටුවන උඩගොමඩිය පදිංචි කේ.කේ. චන්ද්‍රලතා මහත්මිය, කේ.කේ. මහේෂ් මධුෂංක මහතා යන අයගේ නිවෙස්වලට හා ඩබ්. ඒ ඥානවතී මහත්මියගේ හා එම්. ටී. කේ. කුලරත්න මහතාගේ නිවෙස්වලට වැසි දිනවලදී උඩගොමඩිය හස්පීගල ඇහැලගහ හේන මාර්ගය හරහා ගලා බසින අධික වැසි ජලය හේතුවෙන් හානි සිදුවන බව පවසා ඇත. අන්තර ගම්මාන ව්‍යාපෘතිය මඟින් ඉදිකර ඇති මාර්ගයේ අයිතිය සභාව සතු වන බැවින් මෙම අවධානම් තත්ත්වය මඟ හැරවීම සඳහා පැති බැම්මක් හෝ කානුවක් සකස් කර දෙන ලෙස ඉල්ලීම් සිදු කර ඇත.

මෙය හදිසි අවශ්‍යතාවක් නිසා තාක්ෂණික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර සකස් කරන ලද ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කර ඇත. එම ඇස්තමේන්තුව අනුව උඩගොමඩිය හස්පීගල ඇහැලගහ හේන මාර්ගය හරහා ගලා බසින වැසි ජලයෙන් සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා කොන්ක්‍රීට් කාණුවක් බැඳීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු. ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. එම කොන්ක්‍රීට් කාණුව හදලා දෙන්න. එසේ නොවුනහොත් ගෙවල්වලට මෙන්ම මාර්ගවලටත් හානි සිදු වෙනවා.

**<u>ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා.</u>**

ලොකු හානියක් වෙනවා. ඒ නිසා කඩිනමින් හදලා දෙන්න.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>**

අවධානමක් තියනවනම් අපි ඒ වෙනුවෙන් කටයුතු කරන්න බැඳිලා ඉන්නවා. මේ යෝජනාව ලැබී දින කිහිපයක් ඇතුළත තාක්ෂණික නිලධාරී කඩිනම් වාර්තාවක් ලබා දී තිබෙනවා. ඒක හොඳයි. අපේ යෝජනාවලට මේ වාගේ වාර්තා, ඇස්තමේන්තු තාක්ෂණික නිලධාරින් ලබා දෙන්නෙ නැද්ද? එහෙම වෙන්න හේතුව කුමක්ද?

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

මෙම ස්ථානයේ ලොකු ආපදාවක් වෙන්න තියන තැනක්. ඒක නිසා ඇස්තමේන්තු හදන එක ඉක්මන් කළා. මේ සඳහා සභාවෙන් වෙන් කරන ලද මුදල් තියනවා. ඒ නිසා අපි මෙය සකස් කරමු. අපි සභාවට ඉදිරිපත් කරන යෝජනා සඳහා ඇස්තමේන්තු සකස් කර තිබෙනවා. එම ඇස්තමේන්තු අපි පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවට අනුමැතිය සඳහා යවා තිබෙනවා. නමුත් මේ යෝජනාව සඳහත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගන්න වෙනවා.

උඩගොමඩිය හස්පිගල ඇහැලගහ හේන මාර්ගය හරහා ගලා බසින වැසි ජලය නිසා නිවෙස්වලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුව අනුව කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීම සම්බන්ධයෙන් විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 9. කඩ කාමර සඳහා සකස් කරන ලද නව බදු ගිවිසුම සම්බන්ධව.</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අප සභාවට අයත් කඩ කාමර බදු දීමේදී විවිධ කාලසීමාවල එක් එක් බදු ගිවිසුම් මඟින් කඩ කාමර බදු දීම සිදු කරන ලදි. එහෙත් නොයෙක් අවස්ථාවල මෙම ගිවිසුම්වල අදාළ කොන්දේසි ඇතුළත් නොවීම නිසා කඩ කුලිය අය කර ගැනීමේදී මෙන්ම එක්වන් මුදල් අය කර ගැනීමේදී ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ පෑමට සිදු විය. එබැවින් පළාත් පාලන කොමසාරිස්ගේ සහ පළාත් පාලන විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති නීතිඥ මහතෙකුගේ උපදෙස් පරිදි නව ගිවිසුමක් සකස් කරන ලදි. ඒ අනුව මින් ඉදිරියට නව ගිවිසුම අනුව කඩ කාමර බදු දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ සහ පළාත් පාලන විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති නීතිඥ මහතෙකුගේ උපදෙස් පරිදි මෙන්ම විමර්ශන නිලධාරීගෙන්ද උපදෙස් අදහස් ලබා ගෙන මෙම ගිවිසුම සකස් කර තිබෙනවා. අපේ ගරු මන්ත්‍රී නීතිඥ රන්ජන් වීරසේකර මැතිතුමාත් මේ ගිවිසුම පිළිබඳ අවධානය යොමු කර අඩු පාඩු තිබේනම් පෙන්වා දෙන්න. ඉදිරියේදී කඩ කාමර බදු දීම මේ ගිවිසුම අනුව සිදු කරමු. එහි සංශෝධන ඇතොත් අපිට වාසිදායක ලෙස ඒවා වෙනස් කර ගමු.

කඩ කාමර බදු දීම සඳහා සකස් කරන ලද බදු ගිවිසුම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 10. මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 19 කඩ කාමරය පවරා දීම සම්බන්ධව.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 19 කඩ කාමරය ඩබ්. ඒ. ප්‍රදීප් නන්දන මහතාට අයත්ව තිබුණි. 2018.04.30 දින එතුමා මිය ගොස් ඇති අතර, එම කඩ කාමරය සිය නමට පවරා දෙන මෙන් එල්. ඩී. ජයන්තා රෝහිනී වන ඔහුගේ බිරිඳ ඉල්ලීමක් සිදු කර ඇත. මෙම කඩ කාමරය නීත්‍යානුකූලව එල්. ජී. ජයන්තා රෝහනී මියට චක්‍රලේඛන අනුව පවරා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.**

මෙම කඩ කාමරය චක්‍රලේඛන අනුව පවරා දීමට අනුමැතිය ඉල්ලා තිබෙනවා. ඒ නිසා ගැටළුවක් නැහැ.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි මෙම කඩ කාමරය නීත්‍යානුකූලව චක්‍රලේඛන අනුව එල්. ජී. ජයන්තා රෝහනී මියට පවරා දීම සිදු කරමු.

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 19 කඩ කාමරය චක්‍රලේඛ අනුව පවරා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 11. මිද්දෙනිය බස් නැවතුම්පොළ උඩු මහළ කඩ කාමර සඳහා මාසික බදු කුලී තක්සේරු කිරීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අප සභාවට අයත් මිද්දෙනිය බස් නැවතුම්පොළ උඩු මහළ කඩ කාමර සඳහා වර්ෂ තුනක් බලපැවැත්වෙන පරිදි මාසික බදු කුලී තක්සේරු කර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අප වෙත එවා තිබෙනවා. එම තක්සේරු වාර්තා අනුව 2018 අගෝස්තු මස සිට අදාළ කඩ කාමරවලින් බදු මුදල් අය කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

| කඩ කාමර | මාසික කුලිය |
|---|---|
| • 01 , 02 සහ 07, 09 | - 3650.00 |
| • 03 | - 3850.00 |
| • 04 , 06 සහ 08 | - 3900.00 |
| • 10 | - 4000.00 |
| • 05 | - 4100.0 |

ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. එම තක්සේරු වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරන්න.

මිද්දෙනිය බස්නැවතුම්පොළ උඩු මහල කඩ කාමර සඳහා නව තක්සේරු වාර්තාව අනුව බදු මුදල් අගෝස්තු මස සිට අය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 12. කිරම කඩ කාමර සඳහා මාසික බදු කුලී තක්සේරු කිරීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අප සභවට අයත් පහත සඳහන් කිරම කඩ කාමර සඳහා වර්ෂ තුනක් බල පැවැත්වෙන පරිදි මාසික බදු කුලී තක්සේරු කර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අප වෙත එවා ඇත. එම තක්සේරු වාර්තා අනුව කඩ කාමරවලින් අගොස්තු මස සිට බදු මුදල් අය කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

BLOCK NO 01

- 01 සිට 03 දක්වා - 4000.00
- 04 සිට 09 දක්වා සහ 11 සිට 12 - 3800.00
- 10 - 6600.00

BLOCK NO 02

- 01 සිට 03 දක්වා - 3600.00
- 04 සිට 13 දක්වා - 3400.00

ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය ස්ථිර කරන ලදි.

**ගරු. ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා.**

තක්සේරු මුදල වැඩි කඩ කාමරත් තිබෙනවා. කිරම කඩ කාමරවලට ආදායමක් එන්න ලොකු සෙනගක් ගැවසෙන තැනක් නොවේ. ඒ නිසා නැවත තක්සේරු කරන්න කියන්න.

**ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා.**

මෙම මිල වැඩි කඩ කාමර නැවත තක්සේරු කරන්න කියන්න.

**ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා.**

දැනට වඩා පොඩි වැඩි වීමක් තිබෙන්නෙ. ඒ නිසා ගැටළුවක් නැති වෙයි.

**ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා.**

මිද්දෙනිය බස් නැවතුම්පොළ උඩු මහලෙත් බදු මුදල් අඩු කරන්න පුළුවන්නම් හොඳයි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය බස් නැවතුම් පොළ උඩු මහලෙ කඩ කාමරවල තක්සේරු මුදලේ ලොකු වැඩි වීමක් වෙලා නැහැ. ඒ නිසා නැවත තක්සේරු කරන්න අවශ්‍ය නැහැ. කිරම ඇතැම් කඩ කාමරවල තක්සේරු මුදල අඩු වී තිබෙනවා. කිරම කඩ කාමර අංක 01 සිට 03 දක්වා හා අංක 10 කඩ කාමරවල තක්සේරු මුදල වැඩි නිසා නැවත තක්සේරු කරන මෙන් තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා යවන ලෙසත්, එලෙස තක්සේරු කරන තුරු එම කඩ කාමර සඳහා පැරණි මාසික බදු කුලිය අනුව බදු මුදල් අය කිරීමටත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

කිරම කඩ කාමර සඳහා වූ නව තක්සේරු වාර්තාව අනුව අංක 01 සිට 03 දක්වා හා අංක 10 කඩ කාමරවල තක්සේරු මුදල වැඩි නිසා නැවත තක්සේරු කරන මෙන් තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා යැවීමට හා නැවත තක්සේරු කරන තෙක් පැරණි මාසික බදු කුලිය අනුව එම කඩ කාමරවලින් බදු මුදල් අය කිරීමටත්, අනෙක් කඩ කාමර සඳහා තක්සේරු වාර්තාව අනුව අගොස්තු මස සිට මාසික බදු කුලිය අය

කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 13. ගරු මහජන නියෝජිතයින් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන තෙදින පුහුණු සැසිය සඳහා ප්‍රවාහන වියදම් දැරීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

2018 වර්ෂයේ ඡන්ද විසමීම අනුව පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ ගරු මහජන නියෝජිතයින් සඳහා වන පුහුණු වැඩමුළුවක් 2018.අගොස්තු මස 03,04,05 යන තෙදින පුරා ඉනාමළුව, සිගිරිය පාර පිහිටි ඊඩ්න් ගාඩ්න් හොටෙල්හි පැවැත්වීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර ඇත. ඒ සඳහා අප සභාවේ සියළුම මන්ත්‍රීවරුන්ට සහභාගි වන ලෙස දන්වා සිටින අතර, පුහුණුව සඳහා සහභාගි වන මන්ත්‍රීවරුන් වෙනුවෙන් පහත සඳහන් ඇස්තමේන්තුව අනුව වැය ශීර්ෂ 101 – vi – 01 යටතේ වියදම් දැරීම සුදුසු බවත්, එම වියදම් දැරීමට පෙර ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බවත් යෝජනා කරමි.

**දළ වියදම් ඇස්තමේන්තුව.**

| අනු අංකය | කාරණය | ප්‍රමාණය | ඇස්තමේන්තු මුදල රු. ශත |
|---|---|---|---|
| 01 | බස් රථය සඳහා | දින - 03කට - රු. 20000.00 බැගින් | 60000.00 |
| 02 | පුහුණුව සඳහා සහභාගිවන දින (අගෝස්තු 3) උදේ ආහාර සඳහා | දින - 01, මන්ත්‍රීවරු - 30<br>ලේකම් - 01, රියදුරු - 01<br>කෑම එකක් - රු. 250.00 | 8000.00 |
| 03 | පුහුණුව සඳහා සහභාගිවන දින (අගෝස්තු 3) උදේ තේ සඳහා | දින - 02, මන්ත්‍රීවරු - 30<br>ලේකම් - 01, රියදුරු - 01<br>එක් අයෙක් සඳහා - රු. 90.00 | 2880.00 |
| 04 | පුහුණුව අවසන් වී පැමිණෙ දින (අගෝස්තු 5 ) හවස තේ සඳහා | දින - 02, මන්ත්‍රීවරු - 30<br>ලේකම් - 01, රියදුරු - 01<br>එක් අයෙක් සඳහා - රු. 90.00 | 2880.00 |
| 05 | පුහුණුව අවසන් වී පැමිණෙන දින (අගෝස්තු 3) රාත්‍රී ආහාර සඳහා | දින - 01, මන්ත්‍රීවරු - 30<br>ලේකම් - 01, රියදුරු - 01<br>කෑම එකක් - රු. 300.00 | 9600.00 |
| 06 - i | ගමන් වියදම් - ගරු සභාපතිතුමා | දිනකට රු- 500.00 බැගින්<br>දින - 03 ට –රු. 1500.00<br>25% දීමනාව - දින 02 කට රු. 125 බැගින් - රු. 250.00 | 1750.00 |
| | ගමන් වියදම් - ගරු උප සභාපතිතුමා | දිනකට රු- 400.00 බැගින්<br>දින - 03 ට –රු. 1200.00<br>25% දීමනාව - දින 02 කට රු. 100 බැගින් - රු. 200.00 | 1400.00 |
| 06- ii | ගමන් වියදම් - ගරු මන්ත්‍රීතුමන්ලා ( 28 දෙනෙක් සඳහා ) | දිනකට රු- 350.00 බැගින්<br>දින - 03 ට 28 දෙනෙකුට රු. 29400.00 | 34300.00 |

| | | | |
|---|---|---|---|
| | | 25%දීමනාව - දින 02 කට රු. 87.50 බැගින් 28 දෙනෙකුට - රු. 4900.00 | |
| 06 - iii | ගමන් වියදම් - ලේකම් | දිනකට රු- 400.00 බැගින් දින - 03 ට –රු. 1200.00 25% දීමනාව - දින 02 කට රු. 100 බැගින් - රු. 200.00 | 1400.00 |
| | **මුළු වියදම** | | **122210.00** |

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා.</u>**

මට මේ පුහුණු වැඩ සටහන සඳහා සහභාගි වෙන්න බැරි වෙයි. මම මගේ කොට්ඨාසයේ මේ දිනවල අක්ෂි සායනයක් පවත්වනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

මටත් මෙම පුහුණු වැඩ සටහන සඳහා සහභාගි වෙන්න බැරි වෙයි. මිද්දෙනිය නගරයේ ප්‍රදර්ශනය කරන තොරණෙහි අවසාන දවස තුන් වෙනිදා . එම සංවිධායක කමිටුවේ සභාපති මම නිසා අවසාන දවසෙ ඉන්න වෙනවා. දින වෙනස් කර ගන්න පුළුවන්ද කියලා බලන්න. පුහුණු වැඩ සටහන සඳහා මම 04 වෙනිදා උදේට සහභාගි වෙන්නම්

**<u>ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා.</u>**

දින වෙනස් කර ගන්න බැහැ. ඔවුන් යොදා ගත් දිනවල අපි පුහුණුව සඳහා සහභාගි වෙන්න ඕන.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.</u>**

වීරකැටිය හා අම්බලන්තොට ප්‍රාදේශීය සභාවලට මේ පුහුණුව 20 වන දින පැවැත්වුනා. අපි පුහුණුවලට ගිහින් තිබෙන නිසා දන්නවා. සියළු දෙනාට බොහෝ වැදගත්. අළුත් අළුත් නීති රීති සාකච්ඡා කරනවා. ඒ නිසා සියළු දෙනා සහභාගි වෙන්න.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

මෙම පුහුණු වැඩ සටහන අපේ මන්ත්‍රීතුමන්ලාට ගොඩක් වටිනවා. එම පුහුණුවට සහභාගි වුන අපේ අනෙක් සභාවල මන්ත්‍රීවරුත් වැදගත් බව පැවසුවා. අනිවාර්යෙන්ම සහභාගි වෙන්න බලන්න. අපි ඒ සඳහා වැය ශීර්ෂ 101 – vi – 01 යටතේ වියදම් දරනවා. මෙම ශීර්ෂයේ රු. 5993500.00 ක මුදලක් වෙන් කර ඇති අතර, මේ වන විට එම ශීර්ෂයේ රු. 3747741.94 මුදලක් ඉතිරි වී තිබෙනවා.

ගරු මහජන නියෝජිතයින් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන තෙදින පුහුණු සැසිය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන වැය ශීර්ෂ 101 – vi – 01 යටතේ වියදම් දැරීම සම්බන්ධයෙන් විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 14. ඡායා පිටපත් යන්ත්‍රයක් ලබා ගැනීම.</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අප සභාව සතුව ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් පවතින අතර, ඉන් එක් යන්ත්‍රයක් වසර 10 ක් පමණ පැරණි වේ. එබැවින් මෙම යන්ත්‍රයෙන් නිසි පරිදි පැහැදිලි ඡායා පිටපතක් ලබා ගත නොහැකි අතර, නිරන්තරයෙන් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට සිදු වේ. එම නිසා වාර්ෂිකව විශාල පිරිවැයක් දැරීමට සිදුවේ. මේ වන විටත් මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට සිදුව ඇත. මේ නිසා ආයතනයේ සියළු අංශවල

ඡායා පිටපත් එක් යන්ත්‍රයකින් පමණක් ලබා ගැනීමට සිදුව ඇති නිසා මාසිකව පවත්වනු ලබන සභා රැස්වීම් සඳහා අවශ්‍ය ලිපි ලේඛන 4000 ක් පමණ මෙම යන්ත්‍රයෙන් ලබා ගැනීමට සිදුවේ. එමඟින් අනෙකුත් ලිපි බොහෝ ප්‍රමාණයක් පිටපත් කිරීම ප්‍රමාද වන අතර, යන්ත්‍රය නිරන්තරව කාර්මික දෝෂයන්ට ද ලක්වේ. එබැවින් ආයතනයේ කටයුතු වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිළකැඳවීම් කර මිළදී ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. මැෂින් එකක් නොව මැෂින් දෙකක් ගන්න. ආයතනයේ අංශ දෙකටම වාගේම කිරම උප කාර්යාලයටත් , කටුවනටත් ගන්න ඕන. ඒ නිසා මැෂින් දෙකක් ගත්තා කියලා පාඩුවක් නැහැ.

**<u>ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා.</u>**

නැවත නැවත ගන්නවාට වඩා එකවර මැෂින් දෙකක් ගමු. අපෙන් ජනතාවට කාර්යක්ෂම සේවාවක් සිදු කරන්න ඕන.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා.</u>**

මැෂින් දෙකක් තිබෙන නිසා තවත් දෙකක් ගන්න අවශ්‍ය නැහැ. එකක් ගමු.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.</u>**

මැෂින්වල හදිසි රෙපයාර් පැමිණි විට අපි කියන වෙලාවට වැඩ කටයුතු කර ගන්න බැහැ. අපේ කටයුතු ප්‍රමාද වුණාට කමක් නැහැ. අපි මහ ජනතාවට සේවය කරන්නෙ. නමුත් මහජන දිනයකදි එවැනි ප්‍රමාද දෝෂයක් වෙන්න හොඳ නැහැ. සභාව සතු සමහර ලිපි පෞද්ගලික ස්ථානවලින් පිටපත් කරන්න යවන්න සිදු වෙනවා. එහෙම යවන්න බැහැ ඒවා තියනවා. තව මාස තුන හතරකින් නැවත ගන්නවට වඩා එකවර ගන්න මිලකැඳවීම් කරන්න.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. සී. පී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා.</u>**

සභාවේ මුදල් ඉතුරු කරන්න අවශ්‍ය නැහැ. ජනතාවට සේවය කරන්න අපි මුදල් වැය කරන්න ඕන.

**<u>ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා.</u>**

මැෂින් දෙකක් ලබා ගමු. නැවත ගන්න අවශ්‍ය නැහැ. ජනතාව ආවම ෆොටෝ කොපි ගන්න කඩයට යවනවා. එහෙම කරන එක ලැජ්ජයි.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා.</u>**

ආයතනයට මැෂින් දෙකක අවශ්‍යතාවය තහවුරු කර ගෙන තිබෙනවද? අවශ්‍යතාවය මත ගන්න කියලා මම තියනවා. අවශ්‍යතාවය තියෙන්නෙ මැෂින් එකක් නම් ඒක පමණක් ගමු.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අපිට මැෂින් දෙකක් ගන්න අවශ්‍යයි. මේ මාසයේ සභා වාර්තාව ප්‍රමාද වුණෙත් මැෂින් එක කැඩී තිබුණු නිසයි. අපි මිළ කැඳවීම් සිදු කර ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් ලබා ගත යුතු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

සභාව සඳහා අලුතින් ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් ලබා ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 15. කොට්ඨාස මට්ටමින් මාර්ග කි.මී. 05 ක් අළුත්වැඩියා කිරීමේදී අදාළ කොට්ඨාසයේ මාර්ග දෙපස ශුද්ධ පවිත්‍ර කටයුතු හා, වීථි පහන් නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා සභාවේ නිලධාරීන් හා සේවකයින් යොදා ගැනීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අප සභා බල ප්‍රදේශයේ කොට්ඨාස 17 ආවරණය වන පරිදි සංවර්ධනය නොකළ මාර්ග කිලෝ මීටර් 05 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සමගාමීව, කොන්ක්‍රීට් හා කැටගල් අල්ලා ඇති මාර්ග දෙපස ශුද්ධ පවිත්‍ර කිරීම, වීථි ලාම්පු අළුත්වැඩියා කිරීම, ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සායනික සේවා සැපයීම වැනි සුබසාධන සේවා රැසක් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතියක් සකස් කළ යුතු වේ. මේ වෙනුවෙන් ලැබී ඇති ප්‍රතිපාදන හා අය වැය ලේඛනයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුවේ. එහිදි සභාවේ නිලධාරීන් හා සේවකයින් යොදා ගෙන, සභාවේ ප්‍රමාණවත් යන්ත්‍රෝපකරණ නොමැති බැවින් කුලී පදනම මත අරගෙන මෙම වැඩ සටහන ව්‍යාපෘතියක් සකස් කර ප්‍රධාන අමාත්‍ය අනුමැතිය ලබා ගෙන කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. එම්.සී. පී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. පසුගිය දිනවල පැවති අධික වර්ෂාව නිසා කොට්ඨාස 17 හි ගමන් කිරීමට අපහසු ස්ථාන තියනවා. මැෂින් එකක් හෝ දෙකක් අරගෙන මෙම ව්‍යාපෘතිය කඩිනමින් සිදු කරන්න. කරමැටිය නගරය ආශ්‍රිතව පංති පැවැත්වෙනවා. එම නිසා නගරය ආශ්‍රිතව තිබෙන වීථි පහන් ටික අළුත්වැඩියා කර දෙන්න. මෙම වැඩසටහන කඩිනමින් සිදු කරමු.

**ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.**

මෙම වැඩසටහන කඩිනමින් සිදු කිරීම අත්‍යවශ්‍යයි. මම බින්තැන්නෙ මළ ගෙදරක ගියා. එම මාර්ගයේ ගමන් කිරීමට නොහැකි නිසා ගමේ අය ශ්‍රමදානයක් මඟින් වළවල් ටික ගොඩ කර ගෙන තිබුණා. ආදාහනාගාරය ළඟින් ඟග ළඟට යන මාර්ගයත් මෙම වැඩසටහන මඟින් ප්‍රතිසංස්කරණය කරමු. එම නිසා මෙම වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කරමු.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.**

කූඩගොඩ ප්‍රදේශයේ පයින්වත් යන්න බැරි මාර්ග තියනවා. ඉතා ඉක්මනට වාහන කුලියට ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන්න. අපි සකස් කළ යුතු මාර්ග පෙර සභා වාරවලදිත් ලබා දුන්නා.

**ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා.**

අපේ මන්ත්‍රීවරු යෝජනා ගේනවා වාගේම මුදල් ලබා ගන්න කටයුතු කරන්න. අපි මේ මාර්ග සංවර්ධනය සඳහා ලක්ෂ 05 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබෙනවා. තව මැෂින් දෙකක් හා රෝලර් යන්ත්‍රයක් කුලියට ගන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී අවට රාජ්‍ය ආයතන මෙන්ම ගම වෙනුවෙන් යොදාවා සිටින රාජ්‍ය නිලධාරීන් හා ගමේ ප්‍රජාවත් සම්බන්ධ කර ගමු. ගමේ සිටින ජනතාව මේ වගේ සුබ සාධන වැඩ සටහන් සඳහා සහයෝගය ලබා දෙනවා. ඔවුන් සතුව තිබෙන වාහනත් අපිට යොදා ගන්න පුළුවන්. එක් කොට්ඨාසයක සතියක් පමණ මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අදහස් කරනවා. මේ කාර්යය සඳහා අපට තිබෙන සම්පත් සීමිත නිසා පිටතින් කුලී පදනම මත, බැකෝ යන්ත්‍ර, මෝටර් ග්‍රේඩර් හා රෝලර් යන්ත්‍ර ලබා ගන්න වෙනවා. මෙම වැඩසටහන සඳහා ව්‍යාපෘතිය සකස් කර අනුමැතිය ලබාගත් විගස ක්‍රියාත්මක කරමු.

සභා බල ප්‍රදේශයේ කොට්ඨාස මට්ටමින් මාර්ග කිලෝමීටර් පහක් අළුත්වැඩියා කිරීමේදී අදාළ කොට්ඨාසයේ මාර්ග දෙපස ශුද්ධ පවිත්‍ර කටයුතු හා වීදි පහන් නඩත්තු කටයුතු සිදු කිරීම මෙන්ම අනෙකුත් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා සභාවේ සේවකයින් හා නිලධාරීන් යොදා ගැනීම මෙන්ම කුලී පදනම මත යන්ත්‍ර සූත්‍ර යොදා ගෙන ව්‍යාපෘතියක් සකසා ප්‍රධාන අමාත්‍ය අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 16. ඡායා පිටපත් යන්ත්‍රයේ බිල්පත ගෙවීම සම්බන්ධව.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

සභාව සතු pc 31717 අංක දරණ ඡයා පිටපත් යන්ත්‍රය ජෝන් කීල්ස් සමාගම විසින් අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදි. මෙම මැෂින් එක අළුත්වැඩියා කිරීම සඳහා 748073153 දරණ ඉන්වොයිස්පත මගින් රු. 24667.50 ක් වැය වන බව දන්වා ඇති අතර, අළුත්වැඩියා කළ පසු රු. 29031.75 ක බිලක් අප වෙත එවා ඇත. එහිදී ඇස්තමේන්තු මුදලට වඩා බිල්පත වැඩි වී ඇති අතර, ඔවුන්ගේ මෘදුකාංග පද්ධතිවල සිදු වූ දෝෂයක් නිසා එවැනි මුදලක් එකතු වී ඇති බව දන්වා තිබේ. මෙහිදී ඉන්වොයිස්පතෙහි සඳහන් මුදල ගෙවන ලෙස ඔවුන් තවදුරටත් දන්වා ඇත. ඒ අනුව අපි ඉන්වොයිස්පතෙහි සඳහන් රු. 24667.50ක මුදලක් ජෝන් කීල්ස් සමාගමට ගෙවීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉල්ලා ඇති මුදල ගෙවන්න.

සභාව සතු pc 31717 අංක දරණ ඡයා පිටපත් යන්ත්‍රය අළුත් වැඩියා කිරීම සඳහා වැය වූ මුදල් ඉන්වොයිස්පතෙහි සඳහන් පරිදි ජෝන් කීල්ස් සමාගමට ගෙවීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 17. මහජන පුස්තකාල සඳහා වාර්ෂික පොත් ලබා ගැනීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

ජනතාවගේ කියවීමේ උනන්දුව වැඩි කිරීම හා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් පුස්තකාල සේවාව බලප්‍රදේශයේ මිද්දෙනිය, කටුවන, කිරම, වරාපිටිය යන ස්ථාන කේන්ද්‍ර කර ගනිමින් පවත්වා ගෙනු යනු ලැබේ. මෙම මහජන පුස්තකාල සඳහා වර්ෂිකව පොත් මිලදී ගනු ලබයි. ඒ අනුව 2018 වර්ෂය සඳහා පාඨක සමාජවලින් ලබා ගත් පොත් ලේඛන අනුව පුස්තකාල හතර සඳහා අවශ්‍ය පොත් ලේඛනයක් මේ වන විට සකස් කර ඇත. ඒ අනුව 2018 වර්ෂයේ අපගේ මහජන පුස්තකාල සඳහා ඉදිරියේදී පැවැත්වීමට නියමිත දකුණු පළාතේ පවත්වන දක්ෂිණ පොත් ප්‍රදර්ශනයෙන් හා BMICH හි පැවැත්වෙන පොත් ප්‍රදර්ශනයෙන් පොත් මිලදී ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. කටුවන මාතර හටන පොතත් මිලදී ගන්න. එම පොත එස්. ගොඩගේ පොත් සමාගමේ තියනවා.

**ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා.**

පාසල් ළමුන්ට අවශ්‍ය පොත් මිලදී ගැනීමට කටයුතු කරන්න.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි පාඨක සමාජයෙන් ගෙන්විය යුතු පොත් ලේඛනයක් ලබා ගෙන තිබෙනවා. අපේ මන්ත්‍රීතුමන්ලාට අවශ්‍ය පොත් තියනවනම් ඒ පිළිබඳ පුස්තකාලයාධිපතිට දැනුම් දෙන්න. අපි දකුණු පළාතේ පවත්වන දක්ෂිණ පොත් ප්‍රදර්ශනයෙන් හා BMICH හි පැවැත්වෙන පොත් ප්‍රදර්ශනයෙන් පොත් මිලදී ගමු.

2018 වර්ෂයට අපගේ මහජන පුස්තකාල සඳහා දකුණු පළාතේ පවත්වන දක්ෂිණ පොත් ප්‍රදර්ශනයෙන් හා BMICH හි පැවැත්වෙන පොත් ප්‍රදර්ශනයෙන් පොත් මිලදී ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා යෝජනා.

## 06 – අ). මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව - 2018 ජූලි මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

2018 ජූලි මස 10 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාවේ අංක 01 සිට 71 දක්වා වවුචර් සඳහා ගෙවීම් කිරීමටත්, අංක 01 සිට 08 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල |
|---|---|---|---|
| 01 | එස්.කේ.අබේවික්‍රම මිය . කටුවන ප්‍රාදේශීය සභාව. | ගමන් වියදම් | 1380.00 |
| 02 | කේ.එච්.ලලනි දේවිකා මිය. කටුවන ප්‍රාදේශීය සභාව. | ගමන් වියදම් | 778.00 |
| 03 | ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා | ගමන් වියදම් | 6000.00 |
| 04 | එන්.පී.ස්වර්ණලතා මිය. පුවත්පත් නියෝජිත | 2018 මැයි මස වරාපිටිය මහජන පුස්තකාල පුවත් බිල | 5980.00 |
| 05 | එන්.පී.ස්වර්ණලතා මිය. පුවත්පත් නියෝජිත | 2018 අප්‍රේල් මස වරාපිටිය මහජන පුස්තකාල පුවත් බිල | 6485.00 |
| 06 | එන්.පී.ස්වර්ණලතා මිය. පුවත්පත් නියෝජිත. | 2018 මැයි මස කිරම මහජන පුස්තකාල පුවත් බිල | 6670.00 |
| 07 | එන්.පී.ස්වර්ණලතා මිය. පුවත්පත් නියෝජිත | 2018 අප්‍රේල් මස කිරම මහජන පුස්තකාල පුවත් බිල | 7000.00 |
| 08 | සුප්පා වඩිවෙල් මයා. කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස අතිකාල | 8000.00 |
| 09 | කුමාර පලිහක්කාර මයා. කටුවන ප්‍රාදේශීය සභාව. | 2018 මැයි මස අතිකාල | 3272.00 |
| 10 | ආර්.ජේ.ගුණසේකර මයා. කටුවන ප්‍රාදේශීය සභාව. | 2018 මැයි මස අතිකාල | 2045.00 |

| | | | |
|---|---|---|---|
| 11 | සුජිත් ලක්මාල් මයා කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස අතිකාල | 1483.00 |
| 12 | ජී.ඒ.රංජිත් මයා . කටුවන ප්‍රාදේශීය සභාව. | 2018 මැයි මස අතිකාල | 3019.88 |
| 13 | නන්දන කරුණාතිලක මයා කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස අතිකාල | 7034.00 |
| 14 | කේ.රූපසේන මයා. කටුවන ප්‍රාදේශීය සභාව. | 2018 මැයි මස අතිකාල | 2697.60 |
| 15 | සාමාන්‍යාධිකාරී සී/ස වීරකැටිය වි.සේ.ස | 2018.05.15 සිට 2018.05.31 දක්වා ඉන්ධන බිල්පත් පියවීම(ගබඩාවට පෙට්‍රල් 20L/ PF 7414 ඩීසල් 315 L/ RB 3498 ඩීසල් 102L/ RC7796 ඩීසල් 35 L/ZA 2978 ඩීසල් 260L/ ධූමායනය සඳහා ඩීසල් 60 L/ ධූමායනය සඳහා පෙට්‍රල් 12L/RE 8995 ඩීසල් 39L/MOH කටුවන PA 8630 ඩීසල් 69L / 227-5870 ඩීසල් 35L) | 138480.00 |
| 16 | සාමාන්‍යාධිකාරී ශ්‍රී ලංකා දුම්රිය සේවය. කොළඹ 10 | නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම (2018 පෙබරවාරි කේ.කේ.ප්‍රදීපා මිය | 1720.00 |
| 17 | ජී.එම්.නිහාල් චමින්ද මයා කටුවන ප්‍රාදේශීය සභාව | 2018 අප්‍රේල් අතිකාල | 8394.00 |
| 18 | ජී.සමීර මදුශංක මයා කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1400.00 |
| 19 | කේ.කේ.සුනීතා මිය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 720.00 |
| 20 | ඊ.එම්.ධම්මිකා මිය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 740.00 |
| 21 | ජේ.විජේරත්න මයා කටුවන ප්‍රාදේශීය සභාව | 2018 අප්‍රේල් අතිකාල | 744.60 |
| 22 | කේ.ජී.තිළිණි හර්ෂණී මෙනවිය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1360.00 |
| 23 | එස්.පී.දේදුණු සඳරේඛා මෙනවිය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1635.00 |
| 24 | කේ.ජී.තිළිණි හර්ෂණී මෙනවිය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 720.00 |

| | | | |
|---|---|---|---|
| 25 | එම්.ඩී රම්‍යා කුමාරි මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 2190.00 |
| 26 | ඩබ්.ඒ.කේ.ධර්මදාස මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 7917.00 |
| 27 | ඒ.වසන්ත මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 3595.27 |
| 28 | රොෂාන් ඉන්ද්‍රජිත් මයා කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 6612.00 |
| 29 | කේ.ඩබ්.ඒ.චන්ද්‍රාවතී මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 805.00 |
| 30 | කේ.කේ.රංජනී මිය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 2394.00 |
| 31 | අයි.ජී.බුද්ධිකා මෙනවිය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 2186.00 |
| 32 | කේ.පී.නිලුෂිකා මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 2250.00 |
| 33 | කේ.කේ.රංජනී මිය කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 584.00 |
| 34 | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 6051.00 |
| 35 | රුචිර ප්‍රියංකර මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 5386.00 |
| 36 | ඒ.කේ.ඒ.ක්‍රිෂාන්ත මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 3582.00 |
| 37 | ජී.එම්.නිහාල් චමින්ම මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 6747.00 |
| 38 | ප්‍රභාත් ජානක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 4850.00 |
| 39 | ඩබ්.කේ.සුරංග මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මාසය සඳහා නිවාඩු දින වැටුප් ගෙවීම | 8389.75 |

| | | | |
|---|---|---|---|
| 40 | ජී.චමින්ද මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1200.00 |
| 41 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ නීතිගත සංස්ථාව<br>94,පරණ කෝට්ටේපාර, නාවින්න, මහරගම. | කිරම ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා දෙවන කාර්තුව සඳහා අවශ්‍ය ඖෂධ ලබා ගැනීම | 190835.00 |
| 42 | එස්.ජේ.ඒ.ගුණරත්න මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි අතිකාල | 7178.00 |
| 43 | මුදල් භාරකරු<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018. 02.27 / 2018.03.08 / 2018.04.03 යන දිනයන්හි පැවති පරිසර තාක්ෂණ ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීම සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ දීමනා ලබා ගැනීම | 6500.00 |
| 44 | ඊ.ඒ.එන්.රණතුංග මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස පරිවර්තන ගමන් වියදම් | 5000.00 |
| 45 | ඊ.ඒ.එන්.රණතුංග මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 750.00 |
| 46 | කේ.ජී.අනුර මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස පරිවර්තන ගමන් වියදම් | 2208.00 |
| 47 | පී.ජී.මාලා පද්මලතා මිය<br>නාගරික සංවර්ධන අධිකාරිය,හම්බන්තොට දිස්ත්‍රික්කාර්යාලය,හම්බන්තොට | 2018 පෙබරවාරි සහ මාර්තු මස ගමන් වියදම් ( සැලසුම් කමිටු) | 1260.00 |
| 48 | පී.ජී.මාලා පද්මලතා මිය<br>නාගරික සංවර්ධන අධිකාරිය, හම්බන්තොට දිස්ත්‍රික්කාර්යාලය,හම්බන්තොට | 2018 ජුනි මස ගමන් වියදම් ( සැලසුම් කමිටු) | 660.00 |
| 49 | එම්.ජී.දිනේෂා මිහිරාණි මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 680.00 |
| 50 | එන්.ඩී.එස්.එල්.නන්දන කරුණාතිලක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 7175.00 |
| 51 | ජී.සමීර මධුශංක මයා කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාව සතු 252-6085 අංක දරණ කැබ් රථය 2018.06.12 සහ 2018.06.29 | |

| | | | |
|---|---|---|---|
| | | දෙදින අධිවේගී මාර්ගය භාවිතා කිරීම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම | 800.00 |
| 52 | ලේකම් ප්‍රාදේශීය සභාව අම්බලන්තොට | 2018.04.22 වන දින කටුවන ප්‍රාදේශීය සභාවට ගලි බවුසර සේවාව සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම | 31000.00 |
| 53 | සභාපති ඇඹිලිපිටිය නගර සභාව | 2018.05.17 වන දින ඇඹිලිපිටිය නගර සභාවට අයත් ගලි බවුසරය මිද්දෙනිය පොළ භූමිය තුල සේවය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම | 13470.00 |
| 54 | ජේ.ඩිලාන් මයා මිද්දෙනිය පාර, කටුවන | 2018.05.17 සිට 2018.05.31 දක්වා කටුවන මහජන පුස්තකාල පුවත් බිල | 6865.00 |
| 55 | මුදල් භාරකරු කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් ලබා ගැනීම සඳහා (මිද්දෙනිය කාර්යාලය) | 9560.00 |
| 56 | කේ.එච්.ලලනි දේවිකා මිය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1328.00 |
| 57 | කේ.ජී.අනුර මයා කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස පරිවර්තන ගමන් වියදම් | 1974.00 |
| 58 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස්.කටුවන පාර, මිද්දෙනිය. | කටුවන ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික නිලධාරීන්ට අවශ්‍ය කරන 30m ලිනන් ටේප් රෝල් දෙකක් ලබා ගැනීම | 1200.00 |
| 59 | ඊ.එන්.රණතුංග මයා කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස පරිවර්තන ගමන් වියදම් | 4110.00 |
| 60 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස්.කටුවන පාර, මිද්දෙනිය. | කටුවන ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ පදවි ප්‍රාප්තියට අදාලව මිද්දෙනිය කාර්යාලයේ ප්‍රධාන ගේට්ටුව අසල තොරණක් සවි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම (භාකබොන්ඩ් ගම් බොතල් 02 /නයිලෝන් නූල් අඩි 100) | 1300.00 |
| 61 | කේ.ඒ.ජනත් මධූෂ රත්නායක මයා. කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1245.00 |
| 62 | එම්.චම්පිකා චතුරාණි මිය කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස පරිවර්තන ගමන් වියදම් | 1970.00 |
| 63 | එන්.පී.ස්වර්ණලතා මිය. පුවත්පත් නියෝජිත | 2018 ජුනි මස වරාපිටිය මහජන පුස්තකාල පුවත් බිල | 5740.00 |

| | | | |
|---|---|---|---|
| 64 | එන්.පී.ස්වර්ණලතා මිය.<br>පුවත්පත් නියෝජිත. | 2018 ජුනි මස කිරම මහජන පුස්තකාල පුවත් බිල | 6380.00 |
| 65 | මුදල් භාරකරු<br>කටුවන ප්‍රාදේශීය සභාව | 5 වසර ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා වැය වන වියදම් පියවීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම | 15000.00 |
| 66 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස්.කටුවන පාර, මිද්දෙනිය. | කටුවන ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන ජල නළ පද්ධතිය අළුත් වැඩියා කිරීමට අවශ්‍ය 1/2" PVC බට 25ක් ලබා ගැනීම | 3500.00 |
| 67 | ලක්ෂාන් ඇඩ්වර්ටයිසින් සර්විස් වීරකැටිය පාර, මිද්දෙනිය. | මිද්දෙනිය හා කටුවන මහජන පුස්තකාල වලට අවශ්‍ය කරන රබර් මුද්‍රා සැකසීම | 1200.00 |
| 68 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස්.කටුවන පාර, මිද්දෙනිය. | සභාව සතු තණකොළ මැෂිමට අවශ්‍ය නූල් ලබා ගැනීම | 350.00 |
| 69 | සාමාන්‍යාධිකාරී සී/ස වීරකැටිය වි.සේ.ස | 2018.06.01 සිට 2018.06.30 දක්වා ඉන්ධන බිල්පත් පියවීම (227-5163 ඩීසල් 70 L/RC 7796 ඩීසල් 70L/ ධූමායනය සඳහා ඩීසල් 40 L/ ධූමායනය සඳහා පෙට්‍රල් 08L/ZA 2978 ඩීසල් 280L/ග්‍රීස් 15KG/252-6508 ඩීසල් 208 L/ PF7414 ඩීසල් 295 L/RB 3498 ඩීසල් 68 L/227-5870 ඩීසල් 60 L/RE8995 ඩීසල් 42 L/RD4364 ඩීසල් 72 L/ LL6446 ඩීසල් 115 L) | 157776.00 |
| 70 | එම්.එච්.එම්.නිහ්මතුල්ලා මයා නො. 10,සැන්ඩ්ස් පාර, දික්වැල්ල. | කටුවන ප්‍රාදේශීය සභාව සඳහා සේවකයින් බඳවා ගැනීම සඳහා වන ගැසට් නිවේදනය ඉංග්‍රීසි හා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමට අදාල ගාස්තු ගෙවීම | 6315.00 |
| 71 | අරලියා හොටෙල් ඇන්ඩ් රෙස්ටුරන්ට්, බස් නැවතුම්පල පිටුපස,මිද්දෙනිය | සභා රැස්වීමට තේ සංග්‍රහයට අවශ්‍ය ද්‍රව්‍ය හා දිවා ආහාරය සැපයීමවෙනුවෙන් | 15250.00 |

<u>**යෝජනා ;-**</u>

01). කටුවන ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක සති පොළෙහි කසල නිසි පරිදි බැහැර කිරීම සම්බන්ධව අත් පත්‍රිකා මඟින් වෙළෙඳුන් දැනුවත් කිරීමටත්,විධිමත් පරිදි කසල බැහැර නොකරන වෙළෙඳුන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගැනීමට සුදුසු බව නිර්දේශ විය.

02). කටුවන ප්‍රාදේශීය සභා මිද්දෙනිය කාර්යාලයේ වහල ඇස්තමේන්තු සකස් කර අළුත් වැඩියා කිරීමට සුදුසු බව නිර්දේශ විය.

03). 53-1634 අංක දරණ කැබ් රථය සම්බන්ධව යාන්ත්‍රික ඉංජිනේරු වරයා විසින් පෙන්වා දී ඇති පරිදි

I. එන්ජිම පූර්ණ වශයෙන් අළුත් වැඩියා කිරීම
II. ඉදිරි Suspension System එක හා Stearing System එක පූර්ණ වශයෙන් අළුත් වැඩියා කිරීම
III. ඉදිරි වම් දොරෙහි පැති කණ්ණාඩිය අළුතින් යෙදීම
IV. Horne එක අළුතින් යෙදීම හෝ අළුත් වැඩියා කිරීම
V. ඉදිරි Windscreen එක අළුතින් යොදා රථය සම්පූර්ණයෙන් ටින්කරින් කර Paint කිරීම සුදුසු බව නිර්දේශ විය.

04). 227-5870 අංක දරණ වෑන් රථය සම්බන්ධව යාන්ත්‍රික ඉංජිනේරු වරයා විසින් පෙන්වා දී ඇති පරිදි

I. ඉදිරි Suspension පද්ධතිය හා Stearing පද්ධතිය පූර්ණ වශයෙන් අළුත් වැඩියා කිරීම.
II. පිටුපස Wheel Bearing අළුතින් යෙදීම
III. එන්ජිමේ Oil කාන්දුව අළුත් වැඩියා කිරීම
IV. Gear Cable එක අළුතින් යෙදීම
V. Horn එක අළුත් වැඩියා කිරීම
VI. රථය දිරා ඇති ස්ථාන ටින්කරින් කර රථයේ පූර්ණ වශයෙන් තීන්ත ආලේප කිරීම සුදුසු බව නිර්දේශ විය.

05). ZA 2978 අංක දරණ බැකෝ යන්ත්‍රය සම්බන්ධව යාන්ත්‍රික ඉංජිනේරු වරයා විසින් පෙන්වා දී ඇති පරිදි

I. ZA 2978 අංක දරණ බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස සියළුම පින් බුෂ් සැකසීම
II. ඉදිරිපස බකට් එකේ දත් සිවිවන ප්ලේට් එක සහ කටර් දෙක සැකසීම හා එයට අදාල දත් හා ඇණ යෙදීම
III. පිටුපස බැකෝවේ සියළුම පින් බුෂ් සැකසීම
IV. බකට් එක පුපුරා තිබීම හා දත් සවි වන ප්ලේට් එක සහ එම දත් හා ඇණ යෙදීම
V. පිටුපස සපත්තු ජැක් පෙට්ටිවල පින් සහ පෑඩ් යෙදීම
VI. පිටුපස සිග්නල් ලයිට් සවිවන බැකට් පෙට්ටි දෙක උඩට ගැනීම
VII. වයරින් පද්ධතිය සකසා ගැනීම
VII. A/C පද්ධතිය සැකසීම සුදුසු බව නිර්දේශ විය.

06).ජල ගබඩාවට අවශ්‍ය (50mm X 20 mm) 1 1/2" සැඩල් 100ක් හා (110mm X 20 mm) 4" සැඩල් 100ක් ලබා දීමට සුදුසු බව නිර්දේශ විය.

07).සභාව සතු RD 4364 ට්‍රැක්ටරයට අවශ්‍ය ටයර් ලබා දීමට සුදුසු බව නිර්දේශ විය.

08).සභාවේ ලිපි ද්‍රව්‍ය ගබඩාවට අවශ්‍ය

I. 2" සුදු සෙලෝටේප් 25

II. 1" සුදු සෙලෝටේප් 25

III. දම් පාට මුද්‍රිත ෆයිල් කවර 100

IV. රෝස පාට මුද්‍රිත ෆයිල් කවර 100 ලබා දීමට සුදුසු බව නිර්දේශ විය.

ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.**

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාවේ අනු අංක 52 හා 53 යටතේ ඇඹිලිපිටිය නගර සභාවෙන් හා අම්බලන්තොට ප්‍රාදේශීය සභාවෙන් ගලි බවුසර ගෙනත් තිබෙනවා. නමුත් ඇඹිලිපිටිය නගර සභාවේ ගලි බවුසරයට වඩා අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ ගලි බවුසරයෙන් ලොකු බිලක් ඇවිත් තිබෙනවා. එයට හේතුව කුමක්ද?

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා.**

දුර ප්‍රමාණය වෙනස්. ඒ වාගෙම ගලි බවුසර්වල ධාරිතාව වෙනස් අතර, සපයන සේවාවන් අතර වෙනසක් තියනවා. ඒ අනුව මුදල් අය කරන නිසා බිල්පත්වල වෙනසක් තිබෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ ගලි බවුසරයෙන් මිද්දෙනිය පොළ වැසිකිළිය හා කටුවන පොළ මාළු වළ හා වැසිකිළිය ඉවත් කළා. එම බවුසරයේ ධාරිතාව වැඩියි. ඇඹිලිපිටිය නගර සභාවේ ගලි බවුසරය මඟින් මිද්දෙනිය පොළ වැසිකිළිය පමණයි ඉවත් කලේ. ධාරිතාව අඩු බවුසරයක්. අම්බලන්තොටින් ගෙන එන ලද ගලි බවුසරය මඟින් ඉවත් කළ අපද්‍රව්‍ය බහාලීම සඳහා ස්ථානයක් නොමැති බැවින් අපද්‍රව්‍ය සමඟම ගලි බවුසරය යැව්වා. ඒ නිසා බිල්පත වැඩියි. අපි සභාවට ගලි බවුසරයක් ගත්තද අපද්‍රව්‍ය බැහැර කරන්න ස්ථානයක් නැහැ. ඒ නිසා අපිට පිටතින් ගලි බවුසර්වල සේවාව ලබා ගන්න වෙනවා. එමෙන්ම මෙහි ඉදිරිපත් කර ඇති යෝජනාත් ක්‍රියාත්මක කරමු.

2018 ජූලි මස 10 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අංක 01 සිට 71 දක්වා වවුචර් සඳහා ගෙවීම් කිරීමට හා අංක 01 සිට 08 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **06 - ඇ ). වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව - 2018 ජුනි මස**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

2018 ජුනි මස සභාව සතු සියළුම වෙළඳ පොළවල් මඟින් රු. 5262000.00 ක මුදලක් උපයා ඇති අතර, එම මුදලින් රු. 59710.00 ක් ව්‍යාපෘති දීමනා හා පොළ බදු අය කරන්නන් සඳහා කොමිස් වශයෙන් ගෙවීම් සිදු කර ඇත. ඒ අනුව මෙම වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා.**

කාරක සභා යෝජනා යටතේ හැමදාම මේ අංශ පිළිබඳ කතා කරනවා. පසුගිය මාසයේ සභාවේදි ජල ව්‍යාපෘතිය පිළිබඳ වෙනමම අයිතමයක් ලෙස ගෙන කතා කරමු කිව්වා. නමුත් එය මේ සභාවට ඉදිරිපත් කර නැහැ. අපේ සභාවට වැඩිපුර ආදායමක් ලැබෙන්නෙ ජල ව්‍යාපෘතිය මඟින්. එමෙන්ම වැඩිපුර වියදමක් දරන්නෙත් ජල ව්‍යාපෘතිය සඳහා. ග්‍රාම නිලධාරී වසම් බොහෝ ප්‍රමාණයකට සේවාව සපයනවා. එය නිසි පරිදි නඩත්තු කිරීම අපේ වගකීමක්. ජනතාව වෙනුවෙන් වැඩිපුර සේවාවක් සපයන්නේ ද ජල ව්‍යාපෘතියෙනි. නමුත් අපි මේ වන තෙක් ඒ පිළිබඳ කතා කර නැහැ. ලක්ෂ ගණනින් ආදායම් හා වියදම් වෙනවා. නමුත් මේ පිළිබඳ කවුරුත් කතා කරන්නෙ නැහැ. හොරට වතුර ගන්න අය සිටිනවා. අක්‍රිය වූ මීටර් පවතිනවා. ජල ව්‍යාපෘතියේ අඩු පාඩු රැසක් තියනවා. මේ පිළිබඳව සැහැල්ලුවෙන් හිතන්න එපා.

එම නිසා මේ සම්බන්ධයෙන් අපි ලබන සභා වාරයේ සිට වෙනමම අයිතමයක් ලෙස ගෙන කතා කරමු. එමඟින් අපිට ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පවතින ගැටළු, ඒවා විසඳා ගැනීමට ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ අදහස් ලබා ගන්න පුළුවන්. මේ ප්‍රදේශයේ මන්ත්‍රීවරුත් එකතු කර කමිටුවක් තියලා හරි මේ සම්බන්ධව පවතින අඩු පාඩු හා කළ යුතු දෑ පිළිබඳ කතා කරමු. යම් හෙයකින් පැයුම් කාලයක් ඇති වුනොත් ඒ අවස්ථාවේදී දෝෂ දර්ශනයට සභාව ලක් වෙන්නේ ජල ව්‍යාපෘතිය නිසා. එබැවින් ජල ව්‍යාපෘතිය සාර්ථකව පවත්වා ගැනීම ඉතාම වැදගත්. එම නිසා ලබන සභා වාරයේ ජල ව්‍යාපෘතිය වෙනම අයිතමයක් ලෙස ගෙන කතා කරමු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. මන්ත්‍රීතුමා ගිය සභාවෙත් කතා කළා. වාර්තාවේ තිබුණෙ නැහැ.

**ගරු ප්‍රා. ස. ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර මැතිතුමා.**

ජල ව්‍යාපෘතිය පිළිබඳ කතා කරන එක ගොඩක් හොඳයි. කුඩගොඩ ළිඳේ වතුර බොන්න බැහැ කියලා ගමේ අයගේ විරෝධතාවයක් තියනවා. මමත් ගිහින් බීලා බැලුවා. ඒවා බොන්න බැහැ. මම ඒ පිළිබඳ ලේකම් මහතාටත් පැවසුවා. ඒ නිසා වතුර සාම්පල පරික්ෂා කර බලන්න. ඒ නිසා ජලය ෆිල්ටර් කර ලබා දීමට කටයුතු කරන්න. ගමේ අය මෙම ළිඳේ වතුර අඹ වගාවට ගන්නවට කැමති නැහැ. ගමේ අයට තේරුම් කර දීලා අවශ්‍ය කටයුතු සිදු කරන්න වෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

කුඩගොඩ ළිඳ හැඳුවා. නමුත් තවමත් වතුර වදින්නෙ නැති ස්ථාන තියනවා. වතුර බොන්න බැරි බවට අපිට පැමිණිලි ලැබුනෙ නැහැ. අපි මෙම වතුර සාම්පල යවා පරික්ෂා කර බලන්නම්. කුඩගොඩ ළිඳේ වතුර තව පවුල් ලොකු ප්‍රමාණයකට බෙදන්න පුළුවන්. පැයක් වතුර ගහන විට ටැංකි උතුරා යනවා. නමුත් ඔවුන් එහි වතුර අඹ වගාවේ ළිදට ගන්නවට කැමති නැහැ. නමුත් අපිට වතුර වදින්නෙ නැති ස්ථානලවට වතුර බෙදා හරින්න නම් මේ ළිඳෙන් බට ලයින් එකක් අඹවගාවට ගන්න වෙනවා. අඹ වගාවේ ටැංකිවලට වතුර ගැහැව්වොත් පමණයි කුඩගොඩ සෑම ස්ථානයකටම වතුර වදින්නෙ.දැන් වදින්නෙත් මෙහෙන් යන වතුර. එම ව්‍යාපෘතිය තියෙද්දි මෝටරයක් යොදා අපි අඹ වගාවෙ ටැංකිවලට වතුර ගමු. එවිට අනෙක් ප්‍රදේශවල වතුර ප්‍රශ්නයත් විසඳන්න පුළුවන්. අපි ලබන සභා වාරයේ සිට ජල ව්‍යාපෘතිය පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්නම්.

වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 - ඇ) . යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2018 ජුනි මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

සභාව සතු යන්ත්‍රෝපකරණ කුළී පදනම මත ලබා දීමෙන් හා අභ්‍යන්තර වැඩ කටයුතු සිදු කිරීමෙන් රු. 81630.00 ක ආදායමක් ලබා ඇති අතර, යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මඟින් රියදුරු වැටුප් හා දීමනා, යන්ත්‍ර නඩත්තු කටයුතු වෙනුවෙන් රු. 230980.40 ක වියදමක් දරා ඇත. ඒ අනුව මෙම යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා. ස. ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා**

යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතියේ මෝටර් ග්‍රේඩරයෙන් ආදායමක් ලැබිලා නැහැ. නමුත් නඩත්තු වියදමක් තියනවා. වැඩ කරලා නැත්නම් වියදම් වුනේ කුමකටද?

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. සී. එම්. චමිල් උදාර මැතිතුමා.**

අපේ තිබෙන ටිපර් හයර් යනවා. ඒවායෙන් ආදායමක් සභාවට ලැබෙනවා. ඒ පිළිබඳ මේ වාර්තාවට ඇතුළත් කරන්නෙ නැද්ද?

**ගරු ප්‍රා.ස.ම. ඊ. බී. ඉන්දික මැතිතුමා.**

පසුගිය දිනවල සභාවේ ටිපර් රථය පස් අදින්න දීලා ගැටළු මතු වුණා. අපේ රියදුරු මහතා සහ රිය සහායක අනතුරුදායක වැඩක් බව දන්නෙ නැතිවද එවැනි වැඩ කර තිබෙන්නේ. අපි අපේ වාහනය කුලියට ලබා දුන්නාට ඒ පිළිබඳ  සොයා බලන්න ඕන. ඒ වාගෙම රියදුරු සහ රිය සහායක වාහනය සඳහා වග කියන්න ඕන.

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා.**

අපගේ වාහන සම්බන්ධයෙන් යම් ගැටළුවක් ආවනම් ඒ පිළිබඳ රිය සහායක යම් මට්ටමකට වගකියන්න ඕන.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි අපේ යන්ත්‍ර කුලියට දෙන විට ගිවිසුම් අත්සන් කර ලබා දෙනවා. වැඩ නොකර වාහනය තබා ගන්නා දවස් වෙනුවෙන් ගාස්තුවක් අය කරනවා. ටිපර් රථයත් ගිවිසුම් අත්සන් කරලා මුදල් බැඳලා හයිවේ එකට පස් ප්‍රවාහනය සඳහා ලබා දී තිබුණා. නමුත් එහි ගැටළුවක් ඇවිත් තිබුණා.  ගිවිසුම් අත්සන් කර රැගෙන ගිය ආයතනයම ටිපර් රථය නිදහස් කර දුන්නා. ගැටළුවක් වුණු අවස්ථාවේ අපි සම්බන්ධ වුණේ නැහැ. අපි දවසේ කරන ලද කටයුතු පිළිබඳ රියදුරා ගෙන් කරුණු විමසනවා. මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ අඩුපාඩු සකස් කළ නිසා වියදම් තිබෙනවා. නමුත් ඒ මාසය තුළ අපි මෝටර් ග්‍රේඩරයෙන් වැඩක් කලේ නැහැ. ලබන මාසයේ සිට ආදායම් ලබන සියළුම වාහනවල ආදායම් වියදම් සභාවට ඉදිරිපත් කරනවා.

2018 ජුනි මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 - ඈ). 2018.06.01 දින සිට 2018.06.30 දක්වා ඉන්ධන වැය වීම් පිළිබඳ වාර්තාව.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා මෙන්ම ඩෙංගු මර්දන වැඩ සටහන් සඳහා යොදා ගන්නා ලද වාහන වෙනුවෙන් රු 269828.00 ඉන්ධන සඳහා වියදම් දරා ඇත. ඒ අනුව මෙම ඉන්ධන වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි යොජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා.**

මේ ජල බවුසර, කැබ් රථ ධාවනය කරන්නෙ නැද්ද?

**ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා**

මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයට හා රෝලර් යන්ත්‍රයට ඉන්ධන සපයා නැහැ. 53 – 1634 කැබ් රථය ධාවනය නොවේ යනුවෙන් මෙම වාර්තාවේ සඳහන් කර තිබෙනවා. සැබවින්ම මෙම වාහන භාවිතා කරන්න බැරිද?

**ගරු ප්‍රා. ස. ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර මැතිතුමා.**

රෝලර් යන්ත්‍රයට ඉන්ධන සපයා නැහැ. ඒ වාගෙම මාසයක් පමණ වෙනවා. දින 01 වැඩ කරලා තියෙන්නෙ. යන්ත්‍රය සභාවෙත් නැහැ.

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා.**

ජල බවුසර ගොඩක් දුරට නියඟය කාලෙට පමණයි භාවිතා කරන්නෙ. රෝලර් යන්ත්‍රය මේ වන විට හයර් ගිහිල්ලා. ජුනි මාසයේ එක දවසයි වැඩ කර තිබෙන්නේ. පෞද්ගලික ආයතනවල නම් වැඩ නොකරන දින සඳහා යම් මුදලක් අය කරනවා.

**ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා.**

අපේ මැෂින් කුලියට දීමේදී වැඩ නොකරන දින සඳහා මුදල් අය කරනවද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

බැකෝ යන්ත්‍රය, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා ජල බවුසරය ඒ මාසය තුළ ධාවනය කලේ නැහැ. අවශ්‍යතාවය අනුව එම වාහන භාවිතා කරනවා. ඒ නිසා ඉන්ධන නිකුත් කර නැහැ. නමුත් 53 – 1634 කැබ් රථය කැඩිලා. එය සකස් කරන්න යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාව අරගෙන තිබෙනවා. රෝලර් යන්ත්‍රය මේ වන විට කුලියට දී තිබෙනවා. ABC සොයා ගන්න නැති නිසා වැඩ කරලා නැහැ. ගිවිසුම් අත්සන් කරලා මුදල් බැඳලා කුලියට ලබා දී තිබෙනවා. ඒ නිසා අපි රෝලර් සඳහා ඉන්ධන නිකුත් කරන්නෙ නැහැ. වැස්ස නිසා පසු ගිය දිනවල රෝලර් යන්ත්‍රය වැඩ කරලා නැහැ. වැඩ නොකරන එක් දිනයක් වෙනුවෙන් රු. 3500.00 ක මුදලක් අදාළ පාර්ශවයෙන් අපි අය කරනවා.

2018.06.01 දින සිට 2018.06.30 දක්වා ඉන්ධන වැය වීම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 6 - ඉ). කර්මාන්ත කමිටු වාර්තාව - 2018 ජුලි මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

2018.07.12 දින පැවති කර්මාන්ත කමිටු රැස්වීම් වාර්තාව අනුව පහත සඳහන් පරිදි මුදල් ගෙවීමට ඇති කර්මාන්ත, 10% රැඳවුම් මුදල් ගෙවීමට ඇති කර්මාන්ත මෙන්ම අඩු පාඩු සකස් කළ යුතු කර්මාන්ත දක්වා තිබෙනවා. ඒ අනුව මුදල් ගෙවිය හැකි කර්මාන්ත සඳහා මුදල් ගෙවීමටත්, 10% රැඳවුම් නිකුත් කළ යුතු කර්මාන්තවල රැඳවුම් මුදල් නිකුත් කිරීමටත්, අඩු පාඩු සකස් කළ යුතු කර්මාන්තවල අඩු පාඩු සකස් කළ පසු පරික්ෂා කර ලබා මුදල් නිදහස් කිරීම සුදුසු යැයි යොජනා කරමි.

**මුදල් ගෙවිය යුතු කර්මාන්ත.**

01. දඹේතලාව ජල පොම්පාගාරය සඳහා මෝටර් මිලදී ගැනීම - 2017

**<u>10% රඳවුම් මුදල් ගෙවීමට ඇති කර්මාන්ත</u>**

01. කිරම ආයුර්වේද ගොඩනැගිල්ල සකස් කිරීම - 2017

**<u>අඩු පාඩු සකස් කළ යුතු කර්මාන්ත</u>**

01. හඳුගල ගල්ඇන්දගොඩ මාර්ගය සකස් කිරීම - 2016

02. කෙසෙල්වත්ත වැලැනගොඩ පාර කැඩී ඇති කොටස සකස් කිරීම - 2015

03. වැලිපිටිය මැහිමුල්ල පාර සකස් කිරීම.

ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා.</u>**

තාක්ෂණික නිලධාරී නිර්දේශ ලබා දී තිබේ නම් ගෙවීම් කරන්න. මුදල් නිදහස් නොකර තියාගෙන ඉන්න අපිට බැහැ. කර්මාන්ත කමිටු වාර්තාවත් මුද්‍රණය කර ලබා දෙන්න.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

මෙම කර්මාන්ත පිළිබඳ කමිටුව විසින් පරික්ෂා කර අදාල නිර්දේශ ලබා දී තිබෙනවා. ඒ නිසා ගෙවීම් කරන්න තිබෙන කර්මාන්ත පිළිබඳ ගැටළුවක් නැහැ. අනෙක් කර්මාන්ත අඩු පාඩු සකස් කර තාක්ෂණික නිර්දේශය ලබා දුන් පසු ගෙවීම් කරනවා. කර්මාන්ත කමිටුව ප්‍රමාද වෙලා තිබුනේ. ඒ නිසා මුද්‍රණය කරන්න බැරි වුනා. ඒ වාගෙම CR පොතක ලියන නිසා මුද්‍රණය කරලා නැහැ. ඉදිරියේදී මුද්‍රිත කර්මාන්ත කමිටු වාර්තාවක් ලබා දෙන්නම්.

2018.07.12 දින පැවති කර්මාන්ත කමිටු රැස්වීම් වාර්තාව අනුව මුදල් ගෙවීමට ඇති කර්මාන්ත, 10% රඳවුම් මුදල් ගෙවීමට ඇති කර්මාන්ත ගෙවීම් කිරීම හා අනෙකුත් කර්මාන්ත අඩු පාඩු සකස් කළ පසු තාක්ෂණික නිලධාරී නිර්දේශ මත ගෙවීම් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>07. ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රාස. 14 , 16 – 2018 ජුනි මස</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

සභාව මඟින් පවත්වා ගෙන යන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස.16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ප්‍රා.ස. 14 ඒකාබද්ධ වැය සාරාංශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

01. 265 – 1 – 001 – 9 – 7876587 - පොදු අරමුදල් ගිණුම.

02. 265 – 1 – 001 – 2 - 7876595 - පොළ ව්‍යාපෘති ගිණුම

03.. 265 – 1 – 001 – 7 – 7876593 - ජල ව්‍යාපෘති ගිණුම

04. 0072633606 - කර්මාන්ත ගිණුම.

05. 265 – 1 – 001 – 3 – 0020439 - සේවක ණය ගිණුම.

06. 0077187171 - මෙහෙයුම් හා නඩත්තු ගිණුම

ප්‍රා. ස. 16 – 2018 මැයි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය.

ප්‍රා.ස.14 - 2018 මැයි මස ඒකාබද්ධ ගෙවීම් සාරාංශය.

ගරු ප්‍රා.ස.ම. යූ. ජී. ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

2018 ජුනි මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස. 14, 16 සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08. වෙනත් යෝජනා

## 08 – 1. පිළිකා රෝගය සඳහා ආධාර මුදලක් ලබා දීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය, පනාමුර පාර, ඇත්බටුවේ ගෙදර පදිංචි එම්.ජී. කාන්ති මහත්මියට පිළිකා රෝගයක් සෑදී ඇති නිසා අසරණ තත්ත්වයේ පසුවේ. මේ වන විට කරාපිටිය ශික්ෂණ රෝහලෙන් ප්‍රතිකාර ලබා ගන්නා අතර, ඒ සඳහා ලොකු මුදලක් වැය වේ. මේ වැය වන මුදල් දැරීම සඳහා ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති බවත්, ඇයගේ ස්වාමි පුරුෂයාද ගසකින් වැටී රෝගී තත්ත්වයේ පසුවන බවත්, එම නිසා මේ පිළිබඳ අවධානය යොමු කර ආධාර මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. මෙවැනි රෝගාබාධ සඳහා අප විසින් රු. 5000.00 ක ආධාර මුදලක් ලබා දෙන අතර මෙම වර්ෂයේ අය - වැය ලේඛනයේ 207 – 1 ශීර්ෂයෙන් රු. 100000.00 ක මුදලක් වෙන් කර ඇත. ඒ අනුව එම්.ජී. කාන්ති මහත්මියගේ රෝගය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට රු. 5000.00 ක ආධාර මුදලක් ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ඇතිව ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. අදාළ මුදල අනුමත කර ගෙන ලබා දෙන්න.

**ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා**

මෙවැනි රෝග සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා අංශයට යොමු කළ හැකියි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි මෙවැනි රෝගාබාධ සඳහා රු. 5000.00 ක් ලබා දෙනවා. මේ සඳහා ප්‍රධාන අමාත්‍ය අනුමැතිය ලබා ගත් පසු ආධාර මුදල ලබා දෙමු.

එම්.ජී. කාන්ති මහත්මියගේ පිළිකා රෝගය සඳහා සභාව විසින් ලබා දෙන රු.5000.00 ක මුදල ප්‍රධාන අමාත්‍ය අනුමැතිය ඇතිව ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08 – 2. කිරම වෙළඳ සංකීර්ණයට අයත් අංක 24 කඩ කාමරය පවරා දීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

වල්ගම්මුල්ල ග්‍රාම නිලධාරී වසමේ පදංචි එම්.පී.එස්. චමින්ද ප්‍රසාද් රෝහණ මහතා විසින් පවත්වා ගෙන ගිය කිරම වෙළඳ සංකීර්ණයේ අංක 24 කඩ කාමරය ඔහු අසනීප තත්ත්වයේ සිටින නිසා පවත්වා ගෙන යාමට නොහැකි බැවින් 2018. 06.16 දිනැති ලිපිය මඟින් එම කඩකාමරය කිරම, පුස්කොළයාය පදිංචි කේ. කේ. ධනුෂ්ක සංජීව මහතාට ඉදිරියට ඇති සියළුම ගෙවීම් සහ වගකීම් පවරා භාර දෙන ලෙස

ඉල්ලීම් කර ඇත. ඒ අනුව 2018.07.11 දිනැති ලිපිය මඟින් කේ. කේ. ධනුෂ්ක සංජීව මහතා ඉදිරියට ඇති සියළුම ගෙවීම් සහ වගකීම් පවරා භාර ගැනීමට කැමැත්ත කර ඇත. මේ අනුව අංක කිරම වෙළඳ සංකීර්ණයේ අංක 24 කඩ කාමරය කේ. කේ. ධනුෂ්ක සංජීව මහතාට චක්‍රලේඛ හා ගිවිසුම අනුව පවරා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. අයි. කේ. සුසන්ත පද්ම තිලක් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. චක්‍රලේඛ අනුව අවශ්‍ය කටයුතු සිදු කරන්න.

කිරම වෙළඳ සංකීර්ණයට අයත් අංක 24 කඩ කාමරය චක්‍රලේඛ අනුව කේ. කේ. ධනුෂ්ක සංජීව මහතාට පවරා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 – 3. වීථි පහන් නඩත්තු උපකරණ සඳහා වැය අනුමත කිරීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අප සභාවට අයත් කොට්ඨාශ 17 හි වීථි පහන් නඩත්තු කිරීම සඳහා විදුලි උපකරණ මිළදී ගැනීමට සභා අනුමැතියක් ලබා ගත්තා. නමුත් අයවැය ලේඛණය අනුව 503 - iii පිරිවැය යටතේ වීථි පහන් නඩත්තුව සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත. දැනට ඉතිරිව ඇත්තේ රු. 330375.00 ක මුදලකි. නමුත් කරන ලද මිල කැඳවීම් අනුව මෙම උපකරණ සඳහා රු.1581840.00 මුදලක් වැයවන අතර, ඒ සඳහා වැය ශීර්ෂයේ ප්‍රමාණවත් මුදල් නොමැති බැවින්, පහත ශීර්ෂ වලින් මාරුකර අදාල මුදල් වෙන්කර ගෙන වීථිපහන් නඩත්තු උපකරණ මිලදී ගැනීමට සිදු වේ. එම නිසා මෙම වැය ශීර්ෂ මාරු කිරීමට හා මිල කැඳවීම් කර ඇති පරිදි විදුලි පහන් උපකරණ ලබාගෙන බිල්පත් ගෙවීම් කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 304 - i | වාහන උපකරණ හා යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියාව | 1603135.00 |
| 404 - i | වාහන උපකරණ හා යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියාව | 399600.00 |
| 404 - i | වාහන උපකරණ හා යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියාව | 801914.00 |
| 204 - i | වාහන උපකරණ හා යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියාව | 434605.00 |
| 604 - i | වාහන උපකරණ හා යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියාව | 50000.00 |
| 501 - v | අතිකාල හා නිවාඩු දින වැටුප් | 100000.00 |

ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා**

එම ශීර්ෂ වලින් මාරු කරන්න අදාල ශීර්ෂවල ප්‍රතිපාදන තිබෙනවද. ඒවායේ නැවත වියදම් කරන්න අවශ්‍ය වන්නේ නැද්ද.

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා**

ශීර්ෂවල වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නැතිනම් අතුරු අයවැයක් සම්මත කර ගන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

එම ශීර්ෂවල මුදල් තියනවා. ඒ නිසා අපිට ගැටළුවක් වෙන එකක් නැහැ.

වීථිපහන් නඩත්තු උපකරණ මිලදී ගැනීම සඳහා අදාල ශීර්ෂයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් ශීර්ෂ මාරු කර අදාල වීථිපහන් උපකරණ ලබා ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 - 4. නොපැමිණි මන්ත්‍රීවරුන්ට නිවාඩු අනුමත කිරීම.

### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අද දින සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරු ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීවරු දෙපළට නිවාඩු අනුමත කිරිම සුදුසු යැයි යෝජනා කරමි.

01. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා
02. ගරු ප්‍රා.ස.ම. ජේ. චන්ද්‍රලතා මැතිතුමිය

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 – 5. කසල ව්‍යාපෘතියෙහි අපද්‍රව්‍ය කුණු වළට දැමීම සඳහා බැකෝ යන්ත්‍රයක් කුලී පදනම මත යොදා ගැනීම.

### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

කසල ව්‍යාපෘති භූමියෙහි මේ වන විට සේවකයින් නොමැති නිසා දෛනිකව එකතුවන කසල ගොඩගැසී තැන තැන විසිරී තිබෙනවා. ඒ නිසා අවට ජනතාව අපහසුතාවයට පත් වී ඇති අතර, අවට පරිසරය ද අපවිත්‍ර වෙමින් පවතී. එම නිසා මෙම කසල වළක් කපා දැමීම කළ යුතු අතර, ඒ සඳහා සභාවේ බැකෝ යන්ත්‍රය මේ දිනවල අලුත්වැඩියා කටයුතු සඳහා යොදු කර ඇති බැවින්, කුලී පදනම මත බැකෝ යන්ත්‍රයක් ලබාගෙන තැන තැන ගොඩගසා ඇති කසළ වළකට දමා වසා දැමීම සිදු කළ යුතු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ගාමිණී ජයවික්‍රම මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

### ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා

මාර්ග සංවර්ධනය සඳහා අපි බැකෝ යන්ත්‍ර කුලී පදනම මත ලබා ගන්නවා. එවිට මෙම කාර්යය සිදු කරමු.

### ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා

මාර්ග සංවර්ධනය සඳහා බැකෝ යන්ත්‍ර ලබා ගන්නා තෙක් මේ ගැටළුව මෙහෙම තියාගෙන ඉන්න බැහැ. එහෙම වුනොත් ගාමිණී මන්ත්‍රීතුමාට ගෙවල් දාලා යන්න වෙනවා. ඒ නිසා කුලී පදනම මත බැකෝ යන්ත්‍රයක් ලබාගෙන අවශ්‍ය කටයුතු සිදු කරන්න.

### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අපි කුලී පදනම මත බැකෝ යන්ත්‍රයක් ලබාගෙන කසළ ටික වළට දාල වහලා දමමු.

කසළ ව්‍යාපෘති ඉඩමෙහි ඇති කසළ කුලී පදනම මත බැකෝ යන්ත්‍රයක් ලබාගෙන වළවල්වලට දමා වසා දැමීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින්, සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 – 6. විමුක්ති සිසිල ආරණ්‍ය සේනාසනය සඳහා ප්‍රවේශ මාර්ගය සකස් කිරිම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ගොමඩිය ග්‍රාම නිලධාරී වසමේ ඉදිකරමින් පවතින විමුක්ති සිසිල ආරණ්‍ය සේනාසනය වැඩ නිමවා ඉදිරි කාලයේදී භාවිතයට පූජා කිරීමට සැලසුම් කර ඇත. එම නිසා මෙම ආරණ්‍ය සේනාසනය සඳහා ප්‍රවේශ මාර්ගය සකස් කර දෙන මෙන් ඉල්ලීම් කර ඇත. ඒ පිළිබඳ පරීක්ෂා කර බලා තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර සභා අරමුදල් යොදවා සකස් කරදීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා. ස. ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා**

ආගමික ස්ථානයකට යන මාර්ගයක්. ඒක සකස් කර දෙන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි එම මාර්ගය තාක්ෂණික නිලධාරී මඟින් ඇස්තමේන්තු සකස් කර සභා අරමුදල් යොදවා සකස් කර දෙමු.

විමුක්ති සිසිල ආරණ්‍ය සේනාසනය සඳහා ප්‍රවේෂ මාර්ගය සභා අරමුදල් යොදවා සකස් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 – 7. මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 30 කඩ කාමරය සම්බන්ධව

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 30 කඩ කාමරය සමිතා දිල්හානි මහත්මියට පවත්වාගෙන යාමට නොහැකි නිසා එල්.ඒ. කුමාර මහතාට සභා තීරණයක් මත පවරා දීම සිදු කරනු ලැබුවා. එහිදී මොහු හට කී මනි මුදල වශයෙන් රු. 350000.00 ක මුදලක් ගෙවීමට ඇති අතර, ඉන් ලක්ෂයක මුදලක් මේ වන විට ගෙවා අවසන් කර තිබෙනවා. තව රු.250000.00 ගෙවීමට ඇති අතර, තුන් මාසික ඇප තැන්පත් මුදලද ගෙවා අවසන් කර ඇත. මෙම ඉතිරි කීමනි මුදල් එකවර ගෙවීමට නොහැකි නිසා සහන කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව ඉතිරි කීමනි මුදල් මාස 06 ක සහන කාලයක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ටී. ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි අදාළ සහන කාලය තුළ ගෙවන්න කියමු. නැවත සහන කාලයක් නොදී ඉමු.

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 30 කඩ කාමරය සඳහා ඉතිරි කී මනි මුදල් ගෙවීම සඳහා මාස හයක සහන කාලයක් ලබාදීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **8 – 8. හොරේවෙල රොද පාර සකස් කිරීම**

**ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය**

හොරේවෙල කොට්ඨාශයේ පවුල් 20 ට වැඩි ප්‍රමාණයක් පාවිච්චි කරන එමෙන්ම කුඹුරු ඉඩම් වලට ගොවීන් හා වාහන යන එන මාර්ගයකි හොරේවෙල රොද පාර. එම මාර්ගයේ කොටසක් මඩ වී ඇති අතර, එහි ඒ කාලේ පවුල් කිහිපයක් රු. 25000 ක් එකතු කර ශ්‍රමදානයකින් සකස් කරගෙන ඇත. ඉතිරි කොටස මේ වන විට මඩ වී ඇති බැවින් පස් යොදා සකස් කර දෙන මෙන් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පද්මතිලක් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි අදාල මාර්ගය පරීක්ෂා කර තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර සහා අරමුදල් යොදවා ප්‍රතිසංස්කරණය කර දෙන්නම්.

හොරේවෙල රොද පාර ප්‍රතිසංස්කරණය කරදීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## **8 – 9. රිටිගහයාය කොට්ඨාශයේ මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම.**

**ගරු ප්‍රා. ස. ම. ඩබ්.සී.එම් චමිල් උදාර මැතිතුමා**

රිටිගහයාය කොට්ඨාශයේ පහත සඳහන් මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

01. රිටිගහයාය වී මෝල සිට හල්මිල්ලයාය ට්‍රාන්ස්පෝමරය දක්වා මාර්ගය
02. රිටිගහයාය කෝන් අතුර මාර්ගය
03. කොහොම්පෝරුව උපාසක ගෙදර දක්වා මාර්ගය
04. දරමිටිආර හංදියේ සිට හල්මිල්ලයාය හරහා කැවුම්කාවල දක්වා මාර්ගය
05. දෙමටකැටිය සිට මහ ආර දක්වා මාර්ගය
06. දරමිටිආර කැඩුණු බෝක්කුව අසල සිට වසන්ත සංජීව මහතාගේ නිවස දක්වා මාර්ග
07. ජෝති කඩය අසලින් දරමිටිආර මාර්ගය
08. තල්වත්තේ සමරේ රාළහාමි මහතාගේ නිවස අසලින් ඇති මාර්ගය
09. රිටිගහයාය ශාන්ති මාවත

ගරු ප්‍රා. ස. ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි මාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහනක් සූදානම් කර තිබෙනවා. එහිදී මෙම මාර්ග සඳහා ද තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර සහා අරමුදල් යොදවා සිදුකර දෙන්නම්.

රිටිගහයාය කොට්ඨාශයේ පෙන්වා දී ඇති මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 8 – 10. මැදගම්ගොඩ බේකරිය පාර සකස් කිරීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රමනි හල්පෙ ගමගේ මැතිතුමිය**

හොරේවෙල කොට්ඨාශයේ මැදගම්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ මැදගම්ගොඩ පාසලට යන අතුරු මාර්ගයකි මැදගම්ගොඩ බේකරිය මාර්ගය. එම මාර්ගය මැද මඩ වගුරක් ඇති අතර, එය ඉවත් කිරිම සඳහා මාර්ගය දෙපස කාණු සකස් කිරිමට අවට ඉඩම් හිමියන් ඉඩ ලබා නොදේ. මාර්ගය තුළ ඇති මඩ වල නිසා පාසල් යන දරුවන් මෙන්ම අන් අයද බොහෝ අපහසුතාවයට පත් වී ඇත. එම නිසා මේ පිළිබඳ පරීක්ෂාකර බලා මඩ වගුර පස් හෝ බෙරළු අතුරා සකස් කර දෙන මෙන් යෝජනා කරමි.

ගරු ප්‍රා. ස. ම. ජේ.ටී. ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා**

එම ගැටළුව පිළිබඳ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී සම්බන්ධ කරගෙන අවශ්‍ය කටයුතු සිදු කරන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මේ මාර්ගය ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි පාරක්. ඒ පිළිබඳ අපි ස්ථානීය පරීක්ෂණයක් සිදු කර කළ යුතු කාර්යයන් පිළිබඳ ඇස්තමේන්තුවක් සකස් කර සභා අරමුදල් යොදවා සිදු කරමු.

මැදගම්ගොඩ බේකරිය පාර ස්ථානීය පරීක්ෂණයක් කර ඇස්තමේන්තු සකස් කර සභා අරමුදල් යොදවා ප්‍රතිසංස්කරණය කිරිම සම්බන්ධව විවාධිත අදහස් නොවු බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 – 11. වල්ගම්මුල්ල තේක්ක තවාන මාර්ගය පිළිසකර කිරිම

**ගරු ප්‍රා.ස.ම. එම්.සී. පී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා.**

කිරම වල්ගම්මුල්ල වික්‍රමසූරිය මාවතේ තේක්ක තවාන මාර්ගය ඉතාමත් අබලන් තත්වයේ පවතී. දීර්ඝ කාලයක් මෙම පාරවල් පිළිසකර කර නොමැති නිසා පසුගිය වැසි කාලවල ගමන් කිරීම ඉතාමත් අසීරු වී තිබේ. පවුල් 25 ක් 30 ක් පමණ මෙම ප්‍රදේශයේ ජීවත් වන අතර, පාසල් ළමුන්ද මාර්ගය අබලන් වීම නිසා දැඩි අපහසුතාවයකට පත් වී ඇත. එමෙන්ම ප්‍රදේශයේ බොහෝ දෙනෙක් මාර්ගය අබලන් වීම නිසා නොයෙකුත් ගැටළු වලට මුහුණ දෙනු ලැබේ. එබැවින් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩී. රාජසිංහ මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි එම මාර්ගය කොට්ඨාශ 17 හි මාර්ග ප්‍රතිසංස්කරණය කරන විට ඇස්තමේතු සකස් කර සභා අරමුදල් යොදවා පිළිසකර කර දෙන්නම්.

වල්ගම්මුල්ල තේක්ක තවාන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවු බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **8 – 12. මිද්දෙනිය නගරය ආශ්‍රිත ජලය බසිනා ආරවල් පිළිසකර කිරීම.**

**ගරු ප්‍රා.ස.ම. ගාමිණී ජයවික්‍රම මැතිතුමා**

මිද්දෙනිය නගරය ආසන්නයේ පිහිටා ඇති ජලය බසින ආරවල් කිහිපයක් අවහිර වී ඇති නිසා තද වැසි වසින විට ජලය බැස යාමේදී අවහිරතා ඇත. එම නිසා වැසි කාලයට නගරයේ ඇතැම් ප්‍රදේශ මෙන්ම ගෙවල්ද ජලයෙන් යට වීමට ලක් වේ. එබැවින් පහත සඳහන් ස්ථාන පිළිසකර කරන ලෙස යෝජනා කරමි.

01. මිද්දෙනිය වලස්මුල්ල පාරේ රත්නායක ටයර් කඩේ අසල සිට මිද්දෙනිය පොළ පිටුපස දක්වා ආර
02. මිද්දෙනිය වෙළඳ පොලේ මාළු පොළ අසලින් බසින ආර කුඩගල් ආර ජල පොම්පාගාරය දක්වා
03. මිද්දෙනිය හුංගම පාරේ පන්සල අසල බෝක්කුව ගාව සිට වීරකැටිය පාරේ ඉන්ධන පිරිවුම්හල දක්වා
04. මිද්දෙනිය පනාමුර පාරේ සමෘද්ධි බැංකුව ඉදිරිපිට බෝක්කුව අසල පිරිසිදු කිරීම.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

වැසි සමය ඉදරියේදී ආරම්භ වෙනවා. ඊට පෙර මෙම ආරවල් තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර සභා අරමුදල් යොදවා පිළිසකර කරමු.

මිද්දෙනිය නගරය ආශ්‍රිතව ජලය බසිනා ආරවල් පිළිසකර කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **8 – 13. රිටිගහයාය කොට්ඨාශයේ වීථි ලාම්පු සවි කිරීම**

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.සී.එම් චමිල් උදාර මැතිතුමා**

රිටිගහයාය කොට්ඨාශයේ පහත සඳහන් ස්ථානවලට වීථි ලාම්පු සවිකරන ලෙස යෝජනා කරමි.

01. රිටිගහයාය පාසල අසලින් අමුදමන මාර්ගයේ කන්ද මුදුන ස්ථානයේ
02. රිටිගහයාය පාසල ඉදිරිපිට කැවුම්කාවල අගලබඩ වාඩිය නිවස අසල තුන්මංහන්දිය ස්ථානය
03. මීමණකොළදෙනිය දරම්ටිආර මාර්ගයේ මල්කාන්ති ගුරුතුමියගේ නිවස අසල මාර්ගය
04. රිටිගහයාය ශාන්ති මාවත අසලට
05. අමුදමන වැටියේ ගෙදර රොෂාන් මහතාගේ නිවස අසලට
06. තල්වත්ත හන්දිය පාරේ විපුල රාලහාමිගේ නිවස ඉදිරිපිටට
07. තල්වත්ත වොලිබෝල් ක්‍රීඩාංගනය ඉදිරිපිට
08. තල්වත්ත පියතිස්ස කඩය ඉදිරිපිට

ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි විදුලි උපකරණ මිලදී ගෙන තිබෙනවා. ඉදිරි සතිවලදී මෙම ස්ථානවලට වීථි ලාම්පු සවි කර දෙන්නම්.

රිටිගහයාය කොට්ඨාශයේ සඳහන් කරන ලද ස්ථානවලට වීථි ලාම්පු සවි කරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 14. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජිකත්වය ලබා ගැනීම.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය ශ්‍රී ලංකාවේ සියළුම පළාත් පාලන ආයතනයන් නියෝජනය කරන ජාතික මට්ටමේ සංවිධානය වේ. මෙම ආයතනය පළාත් පාලන ආයතන 341 ට අවශ්‍ය පහසුකම් සැපයීමට බැඳී සිටී. මෙම සංසදය මගින් වාර්ෂිකව සමුළුවක් පවත්වා තෝරා ගන්නා අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් පාලනය කරනු ලබයි. එම අධ්‍යක්ෂක මණ්ඩලය මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභාවල නගරාධිපතිවරු හා සභාපතිවරුන්ගෙන් සමන්විත වේ. මෙම පළාත් පාලන සංසදය මගින් පළාත් පාලන ආයතන සඳහා විශාල සේවාවක් සපයනු ලැබේ.

මෙම සංසදය මගින් පළාත් මට්ටමේ ඇති සියළු පළාත් පාලන දෙපාර්තමේන්තු හා ජාතික මට්ටමෙන් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ද වෙනත් රේඛීය අමාත්‍යාංශ සමඟද ඍජු සම්බන්ධතා පවත්වමින් කටයුතු කරයි. පළාත් පාලනය සවිබල ගැන්වීම සඳහා කටයුතු කරන මෙම සංසදය පළාත් පාලන ආයතන වැඩි ප්‍රමාණයක් නියෝජනය වීම ඉතාම වැදගත් වේ. ඒ අනුව අප සභාවද සාමාජික මුදල වන රු. 7500.00 ක් ගෙවා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ සාමාජිකත්ව ලබා ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. අදාළ සාමාජික මුදල ගෙවා සාමාජිකත්ව ලබා ගමු.

රු. 7500.00 ක මුදලක් ගෙවා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ සාමාජිකත්වය ලබා ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 15. රිටිගහයාය වැව අසල ඉදිකර ඇති සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා පහසුකම් ලබා ගැනීම.

**ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය.**

රිටිගහයාය වැව අසල සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ඉදි කර තිබෙනවා. එහි වැඩ අවසන් කර තිබෙනවා. සෞඛ්‍ය මධ්‍යස්ථානයක් බවට පත් කර ගැනීම සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් නැහැ. එම නිසා මේ සඳහා සභාවෙන් හරි සහයෝගයක් ලබා දෙන්න. කාන්තා නියෝජන වන අපෙන් වෙන්න ඕන යුතුකමක්. එබැවින් මේ සඳහා අවශ්‍ය උපකරණ සපයා දෙන මෙන් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා අපිට ප්‍රතිපාදන ලබා දෙන්න විදියක් නැහැ. අපි යටතේ පාලනය වන ආයතනයක් නොවේ. අවශ්‍ය උපකරණ හා සේවාවන් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දෙන්න කියා ඉල්ලීමක් කරන්න ඕන. අපිට පුළුවන් විදියට උපකාරයක් කරන්න බලන්නම්.

රිටිගහයාය වැව අසල ඉදිකර ඇති සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය පහසුකම් පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 09 . ප්‍රගතිය සාකච්ඡා කිරීම.

### ගරු ප්‍රා.ස.ම. එම් . සිරිසේන මැතිතුමා.

කටුවන පංගම්විලයාය මීගහහේන මාර්ගයේ කාණු පිළිසකර කිරීම සඳහා ගිය සභා වාරයේ අනුමැතියක් ලබා ගත්තා. එය පසුගිය දිනක සකස් කර තිබුණා. නමුත් එකතුවී තිබූ වැලි ටික පාර දෙපැත්තට දාලා තිබෙනවා. නැවත වර්ෂාවක් ඇති වුවහොත් ඒවා සේදී පාර මැදට එනවා. එම නිසා දෙපැත්තෙ කාණු පාදා වැලි හා පස් ඉවත් කරන්න ඕන. වැඩේ සිදු කළාට හරියට සිදු කර නැහැ. නමුත් සභාව කළා කියලා නම යනවා. සභාව මෙහෙමද වැඩ කරන්නෙ කියලා ජනතාවට හිතෙයි. මෙලෙස වැඩ කළ විට සභාව හරියට වැඩ කරන්නෙ නැහැ කියලා ජනතාව අතර වැරදි වැටහීමක් ඇති වෙනවා. අපි යම් වැඩක් කරනව නම් හරියට සැළකිලිමත්ව කරන්න ඕන. නමුත් මේ මාර්ගයේ පිළිසකර කිරීම නම් හරියට සිදු කර නැහැ.

### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.

අපි එම මාර්ගයේ වැලි හා පස් මෝටර් ග්‍රේඩරයෙන් ඉවත් කළා. ප්‍රජා ශාලාව ළඟ සිට උඩ පැත්තෙ කාණුව බෝක්කුව ළඟට පැදුවා. එම මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීමට හා වැලි හා පස් ඉවත් කිරීමට බැකෝ යන්ත්‍රයක් තියෙන්න ඕන. අපේ බැකෝ යන්ත්‍රය කැඩිලා නිසා මෝටර් ග්‍රේඩරයෙන් පාර සකස් කලේ. මෙම මාර්ගය සකස් කිරීමේදී එම ස්ථානයේ කොඩිතුවක්කු මන්ත්‍රීතුමාත්, ලේකම් මහතා සහ මමත් සිටියා. ඒ නිසා පාරෙ වැඩ කලේ නැහැ කියන්න බැහැ. ඉදිරියේදී කොට්ඨාස 17 හිම සංවර්ධන කටයුතු සිදු කරන විට මෙම මාර්ගය තවදුරටත් සකස් කරමු.

### ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.

කටුවන ලැබුන්ගමවත්ත දැව කැපුම්හල සම්බන්ධව කර්මාන්ත කමිටුවේ සාමාජිකයින්ට ලිපියක් ඇවිත් තිබෙනවා. ඔබතුමා දැනුවත් කරලද දන්නෙ නැහැ. හේතුව කුමක්ද කියලා දන්නෙ නැහැ.

### ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.

මටත් ලිපියක් ඇවිත් තිබුණා. යාන්ත්‍රික දැව පලන යන්ත්‍රය ඉවත් කිරීම සඳහා සභාවෙන් කොන්දේසි යොදා ඇති බව හරිස්චන්ද්‍ර කුලරත්න මහතා ලිපිය මඟින් දන්වා ඇත. එම යන්ත්‍රය නැතිව කර්මාන්තය පවත්වා ගෙන යා නොහැකි බවත් ඒ වෙනුවට දම්වැල් කියතක් භාවිතා කළ හැකි බවත් දක්වා තිබේ. දම්වැල් කියතක් භාවිතා කිරීම පිළිබඳ අපි කතා කරන්නෙ නැතිව ඇති. අපි ඒ සම්බන්ධව කොන්දේසියක් යොදා නැතිව ඇති. එම කියත යොදා ගැනීම වියදම් අධික බවද පෙන්වා දී තිබෙනවා. දර පලන යන්ත්‍රයට නැවත වරක් අවසර ඉල්ලා තියනවා.

### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් තනිකර පෞද්ගලික ප්‍රශ්නයක් තියෙන්නෙ. මම අපේ නිලධාරියෙකුට ගිහින් බලන්න කිව්වා. අපි යොදන ලද කොන්දේසි හරියට ක්‍රියාත්මක කරන්නෙ නැතිනම් නැවත පරීක්ෂණයක් සිදු කරමු. අපි අඟල් 18 දර පලන්නෙ නැතිව දාන්න පුළුවන් නිසා මේ කොන්දේසිය යොදා තිබෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>**

අඟල් 18 ප්‍රමාණයේ දර පලන්න වෙන අවස්ථා තිබෙනවා. යම් හෙයකින් ගැට සහිත ශාක කොටස් කපන්න වෙන අවස්ථා තිබෙනවා.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අඟල් 18 ප්‍රමාණයේ දර පලන්න අවශ්‍ය නැහැ. ලොකු කොට ගෙනාවොත් අඟල් 18 ප්‍රමාණයට පලන්න ඕන. යම් හෙයකින් ගැට සහිත ශාක කොටස් චේන්ෂෝ එකෙන් කපා දමන්න පුළුවන්. නැවත මේ කොන්දේසිය ඉවත් කරන්න ගිහින් සභාව හැල්ලුවට ලක් වෙන්න බැහැ.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. එච්. චන්ද්‍රසේන මැතිතුමා.</u>**

එම ස්ථානයේ වැරදි වැඩක් සිදු කරනවද කියා ඕන කෙනෙකුට දැන් වුනත් ගිහින් බලන්න පුළුවන්.

**<u>ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා.</u>**

අපේ කොට්ඨාසයේ මෙය තියෙන්නෙ. සභාවට එන්න කලින් සිට තිබෙන ප්‍රශ්නයක්. දාලා තියන කොන්දේසි එකක්වත් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. ඒවා ක්‍රියාත්මක වෙනවද කියලා බලන්න අපිට බැහැ. එහෙම බලන්න අපිට අවශ්‍යත් නැහැ. සභාවෙන් අවශ්‍ය ටික කර ගත්තම යොදන ලද කොන්දේසි ගැන බලන්නෙ නැහැ. පරිසරය විනාශ වෙන එක පමණයි මෙකෙන් සිදු වෙන්නෙ. අපේ ප්‍රදේශයේ ගස් ටික විනාශ වෙනවා. ගහක් කොළක් තියෙන්නෙත්, වතුර ටිකත් ඉතිරි වෙලා තියෙන්නෙ අපේ ප්‍රදේශයේ පමණයි. වහාම තහනම් කරන්න. මම මේකට විරුද්ධයි.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.</u>**

අපි පෙර සභාවාරවල මේ පිළිබඳ පුළුල් ලෙස කතා කළා. මේ පිළිබඳ අපි එන්නට පෙර සිටම කරන ලද පරීක්ෂණ වාර්තා තිබුණා. ඒ සම්බන්ධව අපි විවිධ අවස්ථාවල කතා කළා. මේ කර්මාන්තය පිළිබඳව මන්ත්‍රීවරු නිහඬ විරෝධතාවයක් තියනවද දන්නෙ නැහැ. ඒ වෙලාවෙ මේ කාර්මාන්තය අවශ්‍ය නැහැ කියලා කිහිපදෙනෙක් කිව්වා. මේ වන විට බොහෝ දෙනා මෙම කර්මාන්තය අවශ්‍ය නැහැ කියනවා. කාගෙත් හදවත් ළඟ මේ සඳහා විරෝධතා තියනවා. පරිසර අධිකාරිය කොන්දේසි දාලා සභාව පිට වගකීම පවරා තිබෙනවා. මේ වාගේම කසල සම්බන්ධයෙන් ගාමිණී මන්ත්‍රීතුමා දැඩි අපහසුතාවයට පත් වී තිබෙනවා. නමුත් තවම ඒ ගැටළුව විසඳිලා නැහැ. ගැටළු වැඩි වෙන්න පෙර මේ කර්මානයත් අපිට අවශ්‍ය නැහැ කියමු. අපි අකමැත්තෙන් අනුමත නොකර සිටිමි. පක්ෂයක් ලෙස අපි මේ කර්මාන්තයට විරුද්ධයි.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අපිත් දන්නවා මෙම කර්මාන්තය මේ ප්‍රදේශයට අවශ්‍ය නැහැ කියලා. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම පැමිණිලි ලැබෙනවා. නමුත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් කොන්දේසිවලට යටත්ව අවසර ලබා දෙන්න කිව්වම අපිට නොදී බැහැ. එම නිසා පරිසර කමිටුව නැවත කැඳවා මෙම කර්මාන්තය පරික්ෂා කර අවශ්‍ය තීරණය ලබා දෙන්න. එම තීරණය සභාවට යොමු කර, සභාවෙන් ලැබෙන තීරණය අපි ක්‍රියාත්මක කරමු.

**<u>ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය.</u>**

ගරු සභාපතිතුමනි, පසුගිය දිනක කිරම, කටුවන, මිද්දෙනිය නගර කේන්ද්‍ර කර ගනිමින් ඩෙංගු වැඩසටහනක් පැවැත්වුවා. එහිදී මන්ත්‍රීවරුන්ට තමන්ට ආසන්නතම නගරවලට පැමිණ සහයෝගය ලබා

දෙන්න කිව්වා. නමුත් සියළු දෙනා ඒ සඳහා සහභාගි වුනේ නැහැ. කටුවන අපි හතර දෙනෙක් පමණයි සහභාගි වුනේ. මෙවැනි පොදු කටයුතුවලදී අපි විතරද සහභාගි වෙන්නෙ?

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

ඩෙංගු වැඩසටහනට සහභාගි වෙන්න කියලා අපි සියළු දෙනාම දැනුවත් කළා. ඒ සඳහා බොහෝ දෙනෙක් සහභාගි වී සහයෝගය දැක්වූවා. කිරම, මිද්දෙනිය නගරවල එම වැඩසටහන සාර්ථකව සිදු කළා. ඒ පිළිබඳ සතුටුයි. කටුවන නගරයේ මෙම වැඩසටහන තරමක් දුරට අසාර්ථක වුනා.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මිද්දෙනිය ජල ව්‍යාපෘතිය පිළිබඳ අපි මීට පෙර අවස්ථා කිහිපයකදී කතා කළා. එහිදී ජලය ෆිල්ටර් කර ජනතාවට ලබා දීමේදි ක්‍රමවේදයක් සකස් කරන්න කිව්වා. එවැනි වැඩ සටහනක් සකස් කළා නම් සභාවට ආදායමක් ලබා ගන්නත් පුළුවන්. ජල ව්‍යාපෘතියෙන් සභාවට ලොකු ආදායමක් එනවා. සභාවෙ මුදල් තියනව නම් අපි මේ වැඩසටහන පටන් ගමු. වතුර ලීටරයක් කඩේකින් ගන්න ගියානම් රු. 04 ක් අපි වෙන්න ඕන. මම වගේම සනත් මන්ත්‍රීතුමා, ගාමිණී මන්ත්‍රීතුමා මිද්දෙනියෙ සිටින අය. වැලිපිටිය, මිද්දෙනිය, මුරුංගස්යාය ආදී ප්‍රදේවල ජනතාවට මේ වතුර නිසා ලෙඩ රෝග හැදිලා. එම නිසා මෙම ෆිල්ටර් පද්ධතිය සකස් කර දෙන්න කියා ඉල්ලීම් කරනවා. ඒ වාගෙම මිය ගිය රණවිරුවන් සිහි කිරීම සෑම සභා වාරයකදීම සිදු කරමු.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අපිට මේ පිළිබඳ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න බැහැ. නමුත් අපි මිය ගිය රණවිරුවන් සෑම සභා වාරයකදීම සිහි කරමු. ජල ව්‍යාපෘතියෙන් ලබා දෙන වතුර ලවණ ගතිය වැඩියි. නමුත් සභාවෙ මුදල් තිබෙනවා. ෆිල්ටර් පද්ධතියක් සවි කර ජලය පිරිසිදු කර දෙන්න ලොකු වියදමක් දරන්න වෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන්න උත්සාහ කරමු.

**<u>ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය</u>**

ගරු සභාපතිතුමනි, කාන්තා මන්ත්‍රීවරුන් සඳහා මාතර පුහුණු වැඩසටහනක් පැවැත්වූවා . මේ සඳහා ඔබතුමා ප්‍රවාහන පහසුකම් ලබා දුන්නා. ඒ සඳහා යවන ලද රියදුරු මහතාත් ගොඩක් හොදයි. අපි මන්ත්‍රිතුමියන් සියලු දෙනා වෙනුවෙන් ලබාදුන් සහයෝගයට ස්තුතිය ප්‍රකාශ කරනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා</u>**

පංගම්විලයාය සිට හැඩිවත්තට යන රවුම් පාරක් තියනවා. එක් ස්ථානයක් තියනවා. එම ඉඩම වටෙන් යන්න ඕන. එය සෘජු පාරක් ලෙස සකස් කර ගැනීම සඳහා ඉඩම් හිමියන් තම ඉඩමෙන් පාර දෙන්න කැමතියි. අලුතින් හදන පාරට ජලය, විදුලිය, ලබා දෙන්න පුළුවන්නම් එම මාර්ගය හදා ගන්න තිබුණා.

කටුවන ආදාහනාගාරයේ දුම් කුළුණු සමබර කිරිම සඳහා සවිකර තිබූ කේබල් තුනෙන් එකක් කැඩිලා කැටගල් යට කරගෙන බැද්ද වැවිලා සේවකයින් බඳවා ගැනීමට අවශ්‍ය සභා තීරණ ගත්තා. ඒ සඳහා අනුමැතිය ලැබෙන තෙක් අපිට සිදු කළ යුතු කාර්යයන් තියනවා. ආදාහනාගාරය විවෘත කරන තෙක් අපි එම අවශ්‍ය මූලික පියවරයන් ටික සකස් කරගෙන සිටිමු.

සභාවක් ලෙස ගම්මාන ඇතුලේ සිදු කළ යුතු සේවාව අපිට තවම හරියට කරන්න බැරි වෙලා තියනවා. කාර්තුවකට වැඩි කාලයක් ගිහින් තිබෙනවා. ඒ නිසා ගෙන එන ලද යෝජනා සඳහා ඇස්තමේන්තු හදලා අවශ්‍ය කටයුතු සිදු කරමු.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

ආදාහනාගාරයේ අළුත්වැඩියාව සඳහා කේබල් එක අපි ගැලෙව්වා. වැව්ලා තිබෙන තණකොළ කපා ඉවත් කරනවා. සේවකයින් බඳවා ගැනීම සඳහා අනුමැතියට යවා තිබෙනවා. නමුත් තවම අනුමැතිය ලබා දී නැහැ. අපි අදාළ සංවර්ධන කාර්යයන් සිදු කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ව්‍යාපෘතියක් සකස් කරමින් පවතිනවා. අපිට සෘජුවම සභා අරමුදල් යොදවා සංවර්ධන ව්‍යාපෘති කරන්න බැහැ. ඒ සඳහා චක්‍රලේඛ අනුව කටයුතු කරන්න වෙනවා.

කටුවන නියෝජනය කරමින් දෙරණ ලිටිල් ස්ටාර් සඳහා දියණියක් තරඟ කරවා. මේ වන විට ඇය 06 වන ස්ථානය දක්වා පැමිණ තිබෙනවා. අපි මේ සතියේ එම දියණියගේ නිවසට යන පාර සකස් කර දුන්නා. ඔවුන් සැබවින්ම දුප්පත් හරියට කන්නවත් නැහැ. අපි මන්ත්‍රීවරු එකතු වෙලා දියණිය සඳහා ආධාර කරමු. අපේ නිලධාරීන් වෙනම මූල්‍යමය ආධාර ලබා දෙනවා. ඇය නිසා කටුවන, මිද්දෙනිය කියන නම ඉදිරියට යනවා. ඒක අපිට ලොකු ශක්තියක් ඒ නිසා සියළුම දෙනා හැකි අයුරින් එම දියණිය වෙනුවෙන් ආධාර උපකාර ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා</u>**

අපි සියළු දෙනා මූල්‍යමය වශයෙන් උදවු කරමු. එමෙන්ම කොට්ඨාශ 17 ම මේ පිළිබඳ බැනර් ප්‍රදර්ශනය කරමු.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්.සී.පී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා</u>**

අපි එම දියණිය S.M.S වටයට පැමිණි විට S.M.S යවමු. ගමේ දරුවෙක්.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

අපගේ සහෝදර වීරකැටිය ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී සුරංග මැතිතුමාට අනතුරක් වීමෙන් දණහිසක් බද්ධ කිරීමට සිදු වී තිබෙනවා. ඒ සඳහා ලක්ෂ 7 කට වැඩි මුදලක් වැයවන බවත්, එය සොයා ගැනීමට අපහසු නිසා ආධාර ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. අපේ මන්ත්‍රීවරු තමන්ට පුළුවන් අයුරින් මූල්‍යමය උපකාරයක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>**

අපේ මන්ත්‍රී කෙනෙක්. අපිටත් මේ වගේ දේවල් වෙන්න පුළුවන්. බල කිරීමක් කරන්නෙ නැහැ. නොදුන්නා කියලා ගැටළුවක් නැහැ. මේ මාසයේ බැරිනම් ලබන මාසයේ හරි දෙන්න පුළුවන්. ඒ සඳහා හැකි අයුරින් උදවු කරමු. වීරකැටිය සභාව ඊයේ රැස්වෙලා මේ පිළිබඳ කතා කර තිබෙනවා. ඔහුගේ සැත්කම සඳහා ලක්ෂ 07 ක් වැය වෙනවා. සහෝදර මන්ත්‍රී කෙනෙක්.

ගිය සභා වාරයේ සිරිසේන මන්ත්‍රීතුමා කිරම පුවත්පත් වාර්තාකරු එඩ්මන්ඩ්. සමරජීව මහතා බලන්න යන්න යෝජනාවක් කළා. ඒ සඳහාත් තමන්ට පුළුවන් අයුරින් උපකාර කරන්න. එමෙන්ම කටුවන ලිටිල් ස්ටාර් සඳහා යන දියණියක් පිළිබඳ කතා කලා. ඇයටත් උදව් කරන්න. එයයි අපගේ සමාජ සේවය.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා</u>**

මිද්දෙනිය පනාමුර පාර සුසාන භූමියේ ලුණුමිදෙල්ල ගසක් දිරා තිබෙනවා. එය කඩිනමින් ඉවත් කරන්න. නැත්නම් ගස කඩා වැටුනොත් හානි ගොඩක් සිදු වෙනවා.

**<u>ගරු. සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

අපි ඒ පිළිබඳව අදම නිලධාරියකු යවා පරීක්ෂාකර බලා අවශ්‍ය කටයුතු සිදු කරන්නම්.

## 10 - <u>ස්තූතිය හා නිමාව</u>

අද දින පැවැත්වූ මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා අපේ මන්ත්‍රීවරු සියළු දෙනා සහයෝගය දැක්වූවා. ඒ සඳහා පැමිණී ගරු උප සභාපතිතුමා, ගරු හිටපු සභාපතිවරු දෙපළ හා ගරු මන්ත්‍රීවරු සියලු දෙනාටම මාගේ ආදරණීය ස්තූතිය පුද කරනවා. එමෙන්ම ලේකම් මහතා ඇතුළු නිලධාරී දෙපළටත්, මාගේ ආදරණීය ස්තූතිය පුද කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව. 2.00 ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියහ.

......................

අයි. ජී. මහින්ද මැතිතුමා.

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.